සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සත්පත

ශක වර්ෂ 1945 ක් වූ
මේෂ රවි 15 භාග වෙසක් පුර අටවක
තිථිය ලත් කිවි දින

54 වැනි කාණ්ඩය
47 වැනි පත්‍රය
ආරම්භය 1969 - 05 - 28

වෂී 2023 අප්‍රේල් 28 සිකුරාදා subasetha@lakehouse.lk SUBASETHA, FRIDAY, APRIL 28 2023

## ඥානකාරක බුධ මේෂයේ වක්‍ර වෙයි

# ලග්න දොළොසටම රවි බුධ ආදිත්‍ය යෝගය

### වෘෂභ–සිංහ–වෘශ්චික–කුම්භ හිමියනට සස–මාලවී යෝග මිථුන–කන්‍යා–ධනු–මීන හිමියනට හංස යෝගබල උදාවේ.

වෙශී වොශී උභයචාරීය යෝගබලය රවිගෙන්ද සුනඵා අනඵා, දුරුධරා යෝගබල චන්ද්‍රයාගෙන්ද රවි බුධ ආධිත්‍යය යෝගබල රාශි දෙළොසටමද වෘෂභ, සිංහ, වෘශ්චික, කුම්භ රාශි හිමියනට පංච මහා පුරුෂ යෝගබල අතරින් සස යෝග බලයද, මාලවී යෝග බලයද මීන, ධනු , කන්‍යා, මිථුන රාශි හිමියනට හංස යෝගබලයද උදා කෙරෙමින් විශ්වතාරකා මන්දාකිණියෙහි ඥාණකාරක බුධ වක්‍ර විය.

උත්තරායනය වසන්ත ඍතුවෙහි මේෂ රවි 08 භාග වෙසක් මහේ පුර දියවක තිථිය ආශ්‍රිතව අප්‍රියෙල් මස 21 කිවිදින දහවල් 02.06ට මැයි 15 දින පෙරවරු 08.48 දක්වා දින 24ක කාල පරාසයකට ඥාණකාරක බුධ ග්‍රහයා අඟහරු හිමි මේෂ රාශියෙහි වක්‍ර වෙන්නේය.

මෙකී කාල පරාසය තුළ නැගෙනහිර ක්ෂිතිජයෙහි සිංහ රාශි උදාවේ, 03 වැන්න වූ වික්‍රම ස්ථානගතව කේතු සතුරුවද ප්ලූටෝ සතුරුව රෝග සතුරු ස්ථානය වූ 06 වැන්නේද ස්වක්ෂේත්‍ර සෙනසුරු 07 වැන්නේද බ්‍රහස්පති ස්වක්ෂේත්‍රවද නැප්චූන් ස්වක්ෂේත්‍රව මූල ත්‍රිකෝණව 08 වැන්නවූ මෘත්‍යු ස්ථානගතව ද රවි උච්චව රාහු සතුරුව චන්ද්‍ර , බුධ, යුරේනස් ග්‍රහයන් සමව 09 වැන්නවූ භාග්‍යස්ථානගතවද සිකුරු ස්වක්ෂේත්‍රව 10 වැන්නවූ කර්මස්ථානගතවද අඟහරු සතුරුව අයස්ථානය වූ 11 වැන්නේද සෞරග්‍රහ මණ්ඩලය විද්‍යමාන වෙන්නේය.

බ්‍රහස්පති 22 මාරක දේර්කාණාධිපතියා ලෙසට ද අඟහරු බාධක ග්‍රහයා ලෙසට ද සිකුරු මාන්දි ග්‍රහයා ලෙසට ද මෙකී වක්‍ර මොහොතෙහි දෘෂ්‍යමාන වන්නේය.

මෙම ග්‍රහචාරයට අනුව මෙරට ජනතාව මෙන්ම රාජ්‍ය තාන්ත්‍රිකයන්ද බුද්ධිමත්ව දුර දිග බලා කටයුතු කළ යුතු වන්නේය. රටේ නව නීති රීති අණ පනත් සම්පාදනය මෙන්ම ක්‍රියාත්මක වන කාලයකි. රටේ ජන ජීවිතය හා මූල්‍යමය ස්ථාවරත්වය සඳහා කටයුතු කිරීමට රටවැසියාට ඒකාවන්ව වෙහෙස මහන්සිවීමට සිදුවෙයි. සාමාන්‍ය ජනතාව හා උගත් බුද්ධිමත් ජනතාව දැඩි තීන්දු තීරණ නොගෙන ඉවසීම ප්‍රගුණ කිරීමෙන් යහපත සැලැසෙනු ඇත.

තම ධර්මයට අනුකූලව දිවිගෙවීමට මේ කාලසීමාවේ අදිටන් කරගත යුතුය.

**මේෂ රාශිය**

මෙම තත්ත්වය ඔබේ ලග්නයට බලපාන්නේ මෙලෙසිනි. පදිංචිය, රැකියා, ආදායම් මාර්ග, තැම්පත් දේපළ වස්තු ආශ්‍රිතව නොසිතූ දියුණුවකට පාත්‍ර කෙරෙයි. හවුල් කටයුතු සබඳතා යුගදිවිය ආශ්‍රිතව බුද්ධිමත්ව දූරදර්ශීව ක්‍රියාකළ යුතුය. ආර්ථිකය පිළිබඳව අවධානය යොමු නොකිරීමෙන් වැය පක්ෂය ඉහළ යා හැක. උත්සාහය , උනන්දුව මත ලැබීම් මාර්ග දෙගුණ වෙයි.

**වෘෂභ ලග්නය**

හිස ආශ්‍රිතවද උදරය, කොන්ද තුනටිය ආශ්‍රිතවද වරින්වර රුදා වේදනා, දැවිලි පිච්චිලි ගති මතු කෙරෙයි. තැම්පත් දේපළ වස්තු විසිරී යයි. සිතැඟියාවන් ආකූල ව්‍යාකූල බවට පාත්‍ර කෙරෙයි. ලැබීම් ක්ෂේත්‍රයන් සුළඟට හසුවූ බවක් දැනෙන සුළුයි. උසස් අධ්‍යාපනය, තුරඟ තරඟ, විභාග විජයග්‍රහණ අවහිර කෙරෙනු ඇත. ධර්මානුකූල දිවිපෙවෙත යහපත් වේ.

**මිථුන රාශිය**

හිස, උදරය, කොන්ද, තුනටිය, දණහිස, පාද ආශ්‍රිත වරින්වර රුදා වේදනා, විද්‍යමාන කෙරෙයි. දූ දරුවන්ගේ අධ්‍යාපනික බාධක , ආරම්භක ක්‍රියාකාරකම් මන්දගාමී බවක් ගනු ලබයි. ආරම්භක ක්‍රියාකාරකම් අවහිර වෙයි. සියලු ආකාර ලැබීම් කෙරෙහි මෙන්ම රැකියා ආදායම් කෙරෙහි විසිරුණ බවක් පෙනී යන්නේය. උසස්වීම්ද විජයග්‍රහණ කෙරෙහි ද බාධක එල්ල වෙයි.

**කටක රාශිය**

රැකියා ආදායම් මාර්ග කෙරෙහි සුවිශේෂී අවධානය මතු කෙරෙයි. ලැබීම් අංශ කෙරෙහි මෙන්ම උසස් අරමුණු කෙරෙහි දුබලව සිතනු ලබයි. බුද්ධිමත්ව දූරදර්ශීව කටයුතු කළ යුතුයි. සතුරු බලවේග අභියෝගය මර්දනය කරමින් ක්‍රියාත්මක වෙයි.

**සිංහ රාශිය**

අභිමානනීය ජීවන ගමනකට ඇති උත්සාහය, උනන්දුව යම් තරමක මන්දගාමී බවකට පරිවර්තනය කෙරෙයි. සස යෝගබලය 07 වැන්නේද 10 වැන්නේ මාලවි යෝග බලයද හදිසි ධනලාභ, උසස්වීම්, විජයග්‍රහණ, ප්‍රමාදවූ විවාහ මංගල කටයුතු සාර්ථක වීම ඇතුළු සිතැඟියාවන් බොහෝ දුරට සාර්ථක බවට පාත්‍රවීම කෙරෙහි කැපී පෙනෙයි. අධ්‍යාපනය, සෞඛ්‍යය විවිධ ආදායම් මාර්ග සාර්ථක වෙයි.

**කන්‍යා රාශිය**

බුධ හිමි කන්‍යා ලග්නයෙහි රැකියා ආදායම් මාර්ග සුබදායක වෙයි. සබඳතා , මංගල කටයුතු , සතුටුදායක බවට තුඩුදෙයි. 04 -07 ගුරු හංසයෝග බලැතිව 07 වැන්න ප්‍රබල වෙයි. අධ්‍යාපනය උසස්වීම්, ප්‍රභූ ජනයා හමුවීම සතුටුදායක කෙරෙයි. පදිංචි ස්ථානයයේ පෞද්ගලික ව්‍යාපාරික සේවා දියුණුව කරා පා තබනු ඇත. අප්‍රතිහත ධෛර්යය, උත්සාහය, උනන්දුව, වරින්වර අවරෝහණ කෙරෙන සුළුවෙයි. නව ජීවන ගමන් මඟකට තුඩුදෙන පරිවර්තනකාරී බවක් විද්‍යමාන විය හැක. ප්‍රභූ ජනයාගේ සුවිශේෂී අවධානයද යොමු වෙයි.

**තුලා රාශිය**

කේතු , ශනි, කුජ, ග්‍රහ ත්‍රිත්වය ධර්ම කෝණයෙහි ප්‍රබලවෙයි. 03,07,11 කාමකෝණයට අනුව සිතැඟියාවන්ද බොහෝදුරට සාර්ථක කෙරෙනු ඇත. ප්‍රමාදව තිබූ සබඳතා මංගල සේවා තුරඟ තරඟ විභාග විජයග්‍රහණ සතුටුදායක කෙරෙයි. බාධක අවහිර දුෂ්කරතා දුරුකොට ධනය, බලය, දියුණුව ගෙන දෙයි. ඒ සඳහා උත්සහ ගැන්වීම් වැදගත් වෙන්නෙකි. ආගම දහමට නැඹුරුවෙයි. ජීවිතයෙහි නවතාවයකින් පෙරමුණ බලා ගමන් ගනියි.

**වෘශ්චික රාශිය**

අඟහරු හිමි වෘශ්චිකයේ 04 වැන්නෙහි සස යෝග බලයද 07 වැන්නෙහි මාලවි යෝග බලයද හේතුවෙන් මංගල කටයුතු, සබඳතා ආශ්‍රිතව අතිශය ප්‍රශස්ත බවක් නිර්මාණය වෙයි. හදිසි ආපදා විපත් වලින් අත්මිදී සතුටුදායක බවක් නිර්මාණය වෙයි.

ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී - කොත්මලේ
**විජිත ඩී. ලියනආරච්චි**

2 පිටුව ▶

## ධර්මානුකූලව දිවිගෙවීමට අදිටන් කරගත යුතුය.



# පෙර පින් මතුකරන කර්ම ඵල පූජාව

ඈත අතීතයේ සිටම බෞද්ධ සමාජ රාමුවක් තුළ හැදී වැඩෙන ලාංකිකයෝ තමනට මතුවන ගැටලු දුරු කර ගැනීමට ත්‍රිවිධ රත්නයේ පිහිට පැතූහ. ත්‍රිවිධ රත්නයේ පිහිට ලබා ගැනීමත් ග්‍රහ දෝෂ දුරු කර ගැනීමත් උදෙසා බෝධිය මුල් කර ගනිමින් සිදුකරන පූජාවට හිමි වූයේ ප්‍රධාන ස්ථානයකි.

බෝ ගස යනු විශ්ව ශක්තිය දැඩි ලෙසින් අවශෝෂණය කර ගන්නා ශාකයකි. බෝධි පූජාවට මූලික පදනම එයයි. බෝධියක් ආසන්නයේ සිංහල පැය 2 ට වඩා (සිංහල පැයක් යනු විනාඩි 24කි) රැඳී සිටීමෙන් විහිදෙන හා බෝධියට ලැබෙන විශ්ව ශක්තිය හරහා මනසත් ශරීරයත් සුවපත් වෙයි.

බෝධිය මුල් කරගෙන පැවැත්වෙන පූජා විධි කිහිපයකි. බෝධි පූජාව, නවග්‍රහ පූජාව ආදී ලෙසින් ඒවා සිදු කරෙයි. තම පූර්ව ආත්මීය කර්මයන් වෙනස් කර ගනිමින් යටපත් වී ඇති පුණ්‍ය කර්මයන් මතුකර ගත හැකි විශේෂිත බෝධි පූජාවක් පැරණි සමාජයේ පැවැත ඇත. එය කර්මඵල බෝධි පූජාවයි.

බෝධියට උතුරු පැත්තෙන් පිරිසුදු මේසයක් වැනි දෙයක් තබා ඒ මත සුදු රෙද්දක් එළන්න. කුඩා කෙසෙල් අත්තක් එයට දමන්න. ඉන් පසු පහත අයුරින් බුලත් කොළ 21 ක් තබා ඒ මත පහන් 21 තබන්න. පහන්වලට එළඟි තෙල් දමන්න. පාට 5ක මල් වැඩි ප්‍රමාණයක් කඩා ගෙන එම මල් පහන් වටා හා පහන් අතර අසුරන්න.

පිරිසුදුව පෙරා නිවසින් රැගෙන යන පැන් කළයට සඳුන් කුඩු ටිකක් හා පිච්ච මලක් දමා පහහන් දැල්වීමට පෙර එම ස්ථානයේ ඉතිපිසෝ ගාථාවෙන් 21 වරක් පිරිත් කර ගන්න. ඉන් පසු හරි අඩක් බෝධියට දමන්න. ඉතිරි කොටස නිවෙසට ඉසීමට තබා ගන්න. ඉන් පසු පහන දල්වන්න. එය පහත අයුරින් පිළිවෙළකට සිදු කරන්න.

බුදුරජාණන්ට, බෝගසේ දෙවියන්ට, ප්‍රාදේශීය දෙවියන්ට, රවි දේවතාවන්ට, චන්ද්‍ර දේවතාවන්ට, කුජ දේවතාවන්ට, බුධ දේවතාවන්ට, ගුරු දේවතාවන්ට, ශුක්‍ර දේවතාවන්ට, ශනි දේවතාවන්ට, රාහු දේවතාවන්ට, කේතු දේවතාවන්ට, ශිව දේවතාවන්ට, විෂ්ණු දේවතාවන්ට, ගණේෂ් දේවතාවන්ට, කතරගම දේවතාවන්ට, ලක්ෂ්මී දේවතාවන්ට, දුර්ගා දේවතාවන්ට, අර්ජුණ ප්‍රමුඛ නා ලොවට, රාවණා දෙවිඳුන්ට, සියලු දෙවියන්ට.

පහන් දල්වා තුන් සූත්‍රය සහිතව බෝධි වන්දනාව සිදු කරන්න. බෝධි පූජාව අවසානයේ ඉහත පිළිවෙළට ග්‍රහයන්ට හා දෙවිවරුන්ට පින් අනුමෝදම් කරන්න. මෙම බෝධි පූජාව හරහා පූර්ව ආත්මවලදී සිදු කරන ලද පුණ්‍ය කර්ම හරහා රැස් කර ඇති පින් ක්‍රියාත්මක වීම ඇරඹෙන අතර ඒ හරහා දැනට පවත්නා ගැටලු වේගවත්ව නිරාකරණය වෙයි.

1 වැනි පිටුවෙන්...

උසස් ප්‍රභූ ජනයා ඇසුරට ලැබෙයි. දිගුකාලීනව යටගිය අරමුණු සාර්ථක වෙයි. දූදරු අධ්‍යාපනය සතුටුදායක වෙයි. සිතැඟියාවන් අතරට නිර්නාමික සතුරු අර්බුධ ගැටලු මතුවිය හැක. වාණිජ ව්‍යාපාර සාර්ථක වෙයි. පදිංචියෙහි හදිසි වෙනස්වීම් මතුවෙයි.

### ධනු රාශිය

04 වැන්නෙහි හංස යෝග බලයද 03 - 06 ස්ථාන බලයද අනුව අධ්‍යාපනය, රැකියා ආදායම් මාර්ග සතුටුදායක බවක් උසුළයි. අභිමානනීය ගමන් මඟකට අවතීර්ණ වෙයි. සබඳතා, මංගල කටයුතු ආශ්‍රිතව බාධක අවහිර දුෂ්කරතා පැමිණිය හැක. ස්ථිර පදිංචියෙහි සතුටුදායක බවක් විද්‍යමාන කෙරෙයි. උත්සාහය, උනන්දුව තීව්‍ර කෙරෙනු ඇත. දෛනික දින චර්යාව ක්‍රමවත් වෙයි. ආගමික පැතිකඩ කෙරෙහි දැඩි නැඹුරුවක්ද වෙයි. අයස්ථානයෙහි දුර්වලතා මතුකෙරෙනු ඇත. සබඳතා රැකියා කෙරෙහි බුද්ධිමත්ව දූරදර්ශීව ක්‍රියාකාරී විය යුතුයි.

### මකර රාශිය

02 -06- 10 ස්ථාන ශනි,කුජ, කේතු ග්‍රහ ත්‍රිත්වය මත රැකියා ආදායම් මාර්ග කෙරෙහි යම් යම් විෂමතා බලපෑ හැක. නිර්නාමික සොරසතුරු බලය දෛනිකව උත්සන්න විය හැක. හදිසි ආපදා විපත්ති බලපෑ හැකි බැවින් කල්පනාකාරීව දින චර්යාව ගත කළ යුතුව ඇත. අධ්‍යාපනය, රැකියා ආදායම් මාර්ග ආශ්‍රිතව අවධානය විශේෂයි. හදිසි තීරණ තීන්දු අශුභදායකයි. විවාහ කටයුතු මන්දගාමී බවක්ද පෙනෙයි. මධ්‍යස්ථබව රැකගන්න.

### කුම්භ රාශිය

ලග්නයෙහි සස යෝග බලැති 04 වැන්නෙහි මාලව් යෝග බලයද ප්‍රබලව ක්‍රියාත්මක වෙයි. 02,06,10 ස්ථාන කෙරෙහි හංස යෝග බලයද ක්‍රියාත්මකයි. ශනි,කුජ, කේතු ග්‍රහ ත්‍රිත්වය ධර්ම කෝණය ලෙසටද පෙනෙයි. මේ අනුව අධ්‍යාපනය, සබඳතා ක්‍රියාකාරකම් යටතේ සස යෝග බලය සක්‍රීය කෙරෙයි. පදිංචි ස්ථානගතව නවතාවයක් නව දැක්මක් විද්‍යමාන කෙරයි. උසස් මානසික චින්තනයන් නිර්මාණය වෙයි. නිහඬ නිරහංකාර උසස් සිතැඟියාවන් පහළ කෙරෙයි. නව ජීවන දර්ශනයක සිහිනය සැබෑ කෙරෙනු ඇත.

### මීන රාශිය

01,04,07,10 මීන රාශියෙහි හංස යෝග බලය විහිදෙනු ඇත. එසේම 01,05,09 ධර්ම කෝණයෙහිද දෝෂයන් මර්දනය කෙරෙයි. මේ අනුව සිතැඟියාවන්ද කල්ගතවූ යම් යම් ශුභවාදී කාර්යයන් නිමාකර ගැනීමේ භාග්‍යය වාසනාවද උදාවෙයි. අතපසුවූ දිගුකාලීන අරමුණු රැසක් සමාරම්භ කරලීමෙහි ශක්තිය, ධෛර්ය උදාවෙනු ඇත. අධ්‍යාපනය, රැකියා ආදායම් මාර්ග, සුබසාධන සේවා උපරිමයටම කරළීමේ කුසලතා වර්ධනය වී යාමක් නිර්මාණය කෙරෙනු ඇත. පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ දැඩි අවධානය උදා ග්‍රහයනට අනුව ඉතා සතුටුදායක බවට පත්වීම නිසා යහපත් අරමුණු ක්‍රියාත්මක කළ හැක.

ලග්නය

# එකොළොස්වැනි භාවය

ජන්ම කේන්ද්‍රයේ එකළොස්වන කොටුව හෙවත් එකළොස්වෙනි භාවය අයස්ථානය, ලාභස්ථානය ආදී නම්වලින් හඳුන්වයි. ප්‍රධාන වශයෙන් ආදායම් ලබන ස්ථානය එකළොස්වෙනි භාවය වේ.

සියලු ලැබීම් පිළිබඳව එකළොස්වැන්නෙන් බැලිය යුතු වේ. පියාගෙන් ලැබෙන ධනය පිළිබඳව ද රත්රන්, මුතු, මැණික් ආදී ලැබීම් පිළිබඳව ද හදිසි ධන ලාභ ද, වාසනාව පිළිබඳව ද ණය මුදල් පිළිබඳව ද එකළොස්වැන්නෙන් බැලිය හැකි වේ.

වැඩිමහල් සහෝදරයා සහෝදරිය පිළිබඳව ද ජන්මියාට ලැබෙන හොඳ මිතුරන් පිළිබඳව ද එකළොස් වැන්නෙන් බැලිය හැකි වේ. නමවැන්නෙන් තුන් වැන්න එකළොස්වැන්න වන බැවින් තම පියාගේ මාමා පිළිබඳව ද එකළොස් වැන්නෙන් බැලිය හැකි වේ. හතරවැන්නෙන් අටවැන්න එකළොස්වැන්න වන බැවින් මවට ඇති අසුබ තත්ත්වයන් පිළිබඳව ද එකළොස්වැන්නෙන් බැලිය හැකි වේ.

පොත් පත් ලිවීම සමාජ සේවා වැඩ පිළිබඳව යහපත් අභිමථාර්ථයන් පිළිබඳව ද ලේඛන කලාවෙන් ඉදිරියට යාම සම්බන්ධව ද යහපත් ක්‍රියා, සමාජීය ජයග්‍රහණ සම්බන්ධවද එකළොස් වැන්නෙන් බැලිය හැකි වේ.

බුද්ධිය, ඉගෙනීම සම්බන්ධව ද, ප්‍රඥාව, චිත්‍ර කලාව, ලේඛන කලාව පිළිබඳව ද එකොළොස්වැන්නෙන් බැලිය හැකි වේ. ශරීරයේ කෙණ්ඩා දෙක එකළොස් වැන්න නිරූපණය කරයි.

රවි ග්‍රහයා එකොළහේ සිටි විට හොඳ උසස් මිතුරන් හමු වේ. මිතුරන්ගෙන් උදව් උපකාර ලැබේ. ව්‍යාපාරවලින් ලාභ ලැබේ. දියුණුවට ඉතා යහපත් වේ.

සඳු එකොළහේ සිටීම ඉතා යහපත් වේ. විශාල මිතුරු පිරිසක් ඇති වේ. ස්ත්‍රී පක්ෂයේ අයගෙන් වැඩිපුර උදව් උපකාර ලැබේ. සෑම අතින්ම යහපත් වේ.

කුජ එකළොස්වැන්නේ සිටීමෙන් මිනිරන් මැණික් ආදී ඛනිජ වස්තූන් ලැබීමට ඉඩ තිබේ. කෘෂිකාර්මික කටයුතුවලට යහපත් වේ.

බුධ ග්‍රහයා එකළොස්වැන්නට ඉතා යහපත් වේ. ව්‍යාපාරවලින් ලාභ ලැබේ. උසස් මිතුරන් සමඟ ආශ්‍රය කිරීමට හැකි වේ. ගුරු ග්‍රහයා ද එකළොස්වැන්නට ඉතා යහපත් වේ. යහපත් මිතුරන් ඇති වේ. රැකියාවෙන් බොහෝ ලාභ ප්‍රයෝජන ලැබේ.

සිකුරු ග්‍රහයාට ද එකළොස්වැන්න ඉතා යහපත් ස්ථානයක් වේ. මිතුරන් අධික වේ. වැඩි මහන්සියක් නැතිව ආදයම් ලැබිය හැකි වේ. ග්‍රන්ථකරණයෙහි දක්ෂ වේ. ස්ත්‍රීන්ගේ කරුණාව ආදරය ලැබිය හැකි වේ.

ශනි එකොළහේ සිටි විට මිතුරන්ගෙන් පාඩු විඳීමට සිදුවේ. මිතුරන් අඩු වේ. ඉතා අමාරුවෙන් ආදයම් සොයා ගැනීමට සිදුවේ.

රාහු ග්‍රහයාට එකලොස්වැන්න ඉතා හොඳ ස්ථානයක් වේ. සෑම දෙයකින්ම දිනුම් ලබා දෙයි. සියලු සම්පත් ලබාදෙයි. කේතුට එකොළහ හොඳම ස්ථානයක් වේ. ඉඩකඩම් ධනය ලබා දීමට හොඳ පිහිටීමක් වේ.

චතුරිකා දිල්හානි ගමආරිය

# ඔබේ කේන්ද්‍රයේ ධනවත් වන ග්‍රහයෝග තිබේද?

**මෙලොව උපදින සෑම අයකුටම ධනවත්වීමට ඇති ආසාවේ කෙළවරක් නැත. තුන් කල්හිම ධනවතෙක් වීමේ සිහිනය සැබෑ කර ගැනීමට සෑම නිමේෂයක උත්සාහ දරන බැව් ඇත්තකි. දිළින්දෙක් ලෙස වසර සියයකටත් වඩා සිටියද එක දවසක් ධනවතෙක් වී සිටීම වාසනාවකි.**
**පුහුලන් ඇති වාරේට වවුලන් එනවා සේ අතමිට යහමින් මිල මුදල් ගැවසෙන විට ඕනෑතරම් පිරිස ඒවී. හිනහ වෙන විට අපි සමඟ එක්වී සිනහ වේවි. අපි අඬන විට අප අත්හැර ගොස් ඒ අය අපට සිනහ වේවි. මේ තමා ලෝ දහමේ හැටි.**

උපදින මොහොතේ සකස් කරන වේලා පත්කඩයෙහි ධනය ගැන ග්‍රහයින්ගේ හැසිරීම් හරහා සනිටුහන් වේවි. පෙර කරන ලද පින්පව්වල එලවිපාක කේන්ද්‍රයේ කොටු 12 න් අනාවරණය වන්නේ ය. සල්ලි, මුදල් කාලීන මාතෘකාවකි. අද වෙන විට මුදල් සෑම මිනිත්තුවකම රජ කරන තැනට පත්වී තිබේ. දැන් අපි මේ මුදල් ලැබෙන හැටි කේන්ද්‍රයේ ග්‍රහයින්ගෙන් අසා දැන ගනිමු. ග්‍රහයින් තුන්දෙනෙක් උච්ච වී ඇත්නම් ඔහු ධනවත් වේ. මිල මුදල් අතට ලැබේ. තවද ග්‍රහයින් තුන්දෙනෙක් මූල ත්‍රිකෝණව සිටී නම් උපතින්ම ධනවත් වේ. පුණ්‍යස්ථානය නවය අධිපතියා 5 හේත් 5 අධිපතියා 9 යෙත් සිටි කල මහා ධනවතෙක් වේ.

10 අධිපතියා 5 හේද 4 අධිපතියා 10 යේද සිට ත්‍රිකෝණාධිපතීන් විසින් දුටුවිට මහා ධනකුවේරයෙක් වේ.

ලග්නය 10, 4, 5 අධිපති ග්‍රහයින් බලවත්ව 9 ය අධිපතියා සමඟ යෝගවීම හරහා මහා ධනයක් ඔහුට හෝ ඇයට ලැබේ.

කේන්ද්‍රය අධිපති ත්‍රිකෝණ අධිපතියන් සමඟ එක්වී නම් මහා ධනයකට හිමිකම් ලැබේ.

9 ධනු මීන දෙකෙන් එකක් වී 10 යේ ශුක්‍ර සිටීමෙන් ද ඒ ශුක්‍ර පහ අධිපතියා විසින් දැකීමෙන්ද මහා ධනයක් අත්වේ. සම්පත් අධික වන්නේ ය.

ශුක්‍ර ක්ෂේත්‍රව 5 හේද ශනි 11 හේද උපන්නේ නම් රන්, රිදී, මුතු, මැණික් ලාභ අත්වේ. මුදල් හිමිවේ. මකර, කුම්භ දෙකින් එකක් 5 වැන්න නම් එහි ශනි සිටියදී බුධ 11 වැන්නේ නම් මහා ධනයකට හිමිකම් ඇත. පසුකලෙක ධන කුවේරයෙක් වන්නේ ය.

5 වැන්න සිංහය වී එහි රවි ලාභස්ථානයේ ගුරු සිටීමෙන් ද රන්, රිදී, මුතු, මැණික් ආදී මහත් සම්පත් ලැබේ. හදිසි ධනයක් අත්පත් වේ.

ධනු මීන දෙකින් එකක් 5 වැන්න නම් එහි ගුරු සිටි විට කුජ බුධ දෙදෙනාම 11 සිටිය විට මහා ධන කුවේරයකු වන්නේ ය.

සිංහ ලග්නය වී රවි ගුරු කුජ සිටීමෙන්ද දිනෙන් දින මිල මුදල් ලැබී ධනවත් වේ.

කටක ලග්නය වී සඳු, කුජ, ගුරු තිදෙනාම සිටී නම් මහා ධනවතෙක් වන්නේ ය. මේෂ, වෘශ්චික ලග්නයක් වී කුජ, බුධ, කිවි, ශනි ග්‍රහයින් සිටීමෙන් විශාල ලෙස සම්පත් මිල මුදල් ලැබේ.

ධනු, මීනය වී කුජ ගුරු සඳු සිටීමෙන් ධනවතෙක් වේ. සැප සම්පත් හිමිවේ. ජන්ම ලග්නය කන්‍යා, මිථුන දෙකින් එකක් වී බුධ, ශනි කිවි සිටීම නිසා විශාල ධනවතෙක් වන්නේ ය.

වෘෂභ, තුලා ලග්නය වී ශුක්‍ර සිට බුධ, ශනි දෙදෙනාම දක්නා විටදී මහත් වූ ධන සම්පත් හිමිවේ.

යමෙකුගේ උපන් වේලාවේ රවි කෙරෙන් චන්ද්‍රයා හැර ඉතිරි ග්‍රහයින් 2 වැන්නේ සහ 12 වැන්නේ සිටිය දී "උභයචාරී" යෝගය උදාවේ. කාන්තාවක් නම් දැකුම්කලු සිරුරක් ද පුරුෂයෙක් නම් කඩවසම් දේහයකින් පිරිපුන් වේ. මෙම යෝගයෙන් මැදිවියේ සිටම මහා ධනකුවේරයෙක් වේ.

එක් භාවයකට පැමිණ ග්‍රහයින් සුබව 4 දෙනෙක්ම සිටීමෙන් හෝ 3, 5, 9 යන තැන්වල සිටි ග්‍රහයින් හේතුකොටගෙන මහා ධනවතෙක් වේ.

ඉතාම දුගී දුප්පත් පවුලක උපන්නත් ක්‍රම ක්‍රමයෙන් විශාල ලෙස මුදල් ලැබී මහා ධනවතෙක් වේ.

සඳුගෙන් 6, 7, 8 යන රාශි ත්‍රිත්වය කරා ගිය බුධ, ගුරු, කිවි යන ග්‍රහයින් නිසාම අධියෝගය සෑදේ. මෙම යෝගයෙන් උපන්නේ නම් අති විශාල මහත් වූ ධනයක් ලැබීමේ වාසනාව තිබේ.

හතර කේන්ද්‍රයේ සියලු ශුභ ග්‍රහයින් සිට 6 වැන්න අටවැන්න ග්‍රහයින් නොමැතිවද සෞම්‍ය ග්‍රහයින් සතර කේන්ද්‍රයේ වීමෙන්ද ලග්නාධිපතියා ශුභයින් සමඟ කේන්ද්‍ර ගතවීම හරහා (පර්වත යෝගය) උදාවේ. මේ යෝගයෙන් උපන්නේ නම් ශිල්ප ශාස්ත්‍රය දත් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා යන පංච මහා සම්පත්තියම හිමි ජන ප්‍රධානීයෙක් වේ. තවද මහ ධනකුවේරයෙක් වන්නේම ය.

ඔබේ කේන්ද්‍රයෙත් මෙවැනි ග්‍රහ හැසිරීම් රටාවක් ඇඳී තිබේ දැයි පරීක්ෂා කර බලන්න. ලොතරැයි ජයක් හිමිවේ දැයි කල්තබා දැන ගැනීමට ද හැකිවේවි.

ජ්‍යොතිෂවේදී,
**ටී. හෙන්රි බෙම්මුල්ල**

**යමකුගේ උපන් වේලාවේ රවි කෙරෙන් චන්ද්‍රයා හැර ඉතිරි ග්‍රහයින් 2 වැන්නේ සහ 12 වැන්නේ සිටිය දී "උභයචාරී" යෝගය උදාවේ. කාන්තාවක් නම් දැකුම් කලු සිරුරක් ද පුරුෂයෙක් නම් කඩවසම් දේහයකින් පිරිපුන් වේ. මෙම යෝගයෙන් මැදිවියේ සිටම මහා ධනකුවේරයෙක් වේ.**
**එක් භාවයකට පැමිණ ග්‍රහයින් සුබව 4 දෙනෙක්ම සිටීමෙන් හෝ 3, 5, 9 යන තැන්වල සිටි ග්‍රහයින් හේතුකොටගෙන මහා ධනවතෙක් වේ.**





# සෙත ශාන්තිය උදාකර බත් මහේ දෙනු ලබන කිරිඅම්මා දානය

අප්‍රේල් මාසයේ කෙම්මුර දිනයකදී බොහෝ විට දෙනු ලබන කිරි අම්මාවරුන්ගේ දානය ඉරිදා දිනයන්හි දී ද දීමට සමහරුන් කටයුතු කරති. මෙසේ කෙම්මුර දිනයක් ලෙසින් ගණන් ගනු ලබන්නේ දේව පූජා තබන සෙනසුරාදා හා බදාදා යන දිනයන් ය. පත්තිනි දේවිය වෙනුවෙන් කරනු ලබන පූජාවන් අතර කිරි අම්මාවරුන්ට දෙනු ලබන කිරි දානය විශාල සෙතක් ශාන්තියක් ලැබෙන මහඟු පින්කමකි.

මෙම දානය දෙනු ලබන්න්නේ පවුලේ අසමගිතාවය ලෙඩරෝග වසංගත රෝග දුක් කරදර දියුණුව අඩපණ වීම ආදී කරුණු රැසක් මුල්කරගනිමිනි. ඒ වෙනුවෙන් පත්තිනි දේවියගෙන් සෙත ශාන්තිය හා සියලු දුක්කරදර දුරු කරදෙන ලෙස ඉල්ලා පඬුරක් ගැටගසා පසුව නිදහස් කිරීම සඳහා කිරිදානය දෙනු ලබයි.

පත්තිනි දේවියගෙන් සෙත ශාන්තය පවුලේ ආරක්ෂාව ලබාදෙන ලෙස කන්නලව් කරමින් පඬුරු ගැටගසන අවස්ථාවේදී ඉහත සඳහන් කරුණු වගේම ඇස්වහ කටවහ හෝවහ දුරු වී නිවසේ සාමය සතුට වගේම සොම්නස වර්ධනය වී යක්ෂ භූත ප්‍රේත අමනුෂ්‍යයන්ගෙන්ද ඇතිවන දුක් කරදර දුරලන ලෙසටද ඉල්ලා සිටියි.

කිරි අම්මාවරුන්ගේ දානය සමහර ප්‍රදේශවල යම් යම් වෙනස් ආකාරයටද දෙනු ලබයි. කිරි දානය සඳහා කිරි අම්මාවරුන් සොයා ගැනීමද වඩාත්ම සැලකිලිමත්ව සිදු කළ යුතු ය. පස්පවෙන් වැළකී සිටින නීරෝගී කුලවත් හා සිල්වත් තරුණ මවුවරුන් තෝරාගත යුතු ය. කිරි දානය සඳහා දරුවන් නොමැති කනවැන්දුම් අංගවිකල වූ මහලු වූ දුෂ්ට චරිත ඇති ස්ත්‍රීන්ට දානයදී පලක් නොවේ. නමුත් කිරිදෙන දරුවන් සිටින තරුණ මවුවරුන් සොයා ගැනීම අසීරු කරුණක් වී ඇති බැවින් බොහෝ ප්‍රදේශවල කිරිදානය සඳහා කැඳවාගනු ලබන්නේ පතිදම් සුරකින පන්සිල් හෝ අටසිල් රකින නිරෝගී මෙත් කරුණා සාදුගුණ ඇති කාන්තාවන් ය.

කිරි අම්මාවරු සත් දෙනකු කැඳවා දානය දීමට ප්‍රථම ඒ සඳහා පුරපක්ෂයේ කෙම්මුර දිනයක් වීම වඩාත් සුදුසු ය. ඒ සඳහා මුලින්ම නිවස සෝදා පවිත්‍ර කොට සුවඳ දුම් අල්ලා සුවඳ ජලය ඉස පිරිසුදු කරගත යුතු ය. කිරිදානය සඳහා කිරිබත් කෑලි 56, කෙසෙල්ගෙඩි, කෝපි කෝප්ප 8, කැවුම් 56, කිරියා කිරි කෑලි 56, මැටි පහන් 8, කපුරු පෙත්තක්, පහන්තිර 8, පඬුරු 8 හා බුලත් 7 සූදානම් කළ යුතු ය. ගම්බදව පෙර කිරි දානය දෙනු ලැබුවේ කිරිමව්වරුන් හත්දෙනකු පිරුවට ඇඳ සැරසී උදෙන්ම නිවසට පැමිණිවිට ඔවුන් පිළිගෙන නිවසේ සාලයට කැඳවා ගෙන ගොස් බිම පැදුරු එළා සුදු ඇතිරිල්ලක් එලා ඒ මත ඉඳ ගැනීමට සලස්වමිනි. එසේ කරනු ලබන්නේ කිරි අම්මලා සත් දෙනාගේ පා දෝවනය කිරීමෙන් පසුවය. සුදු ඇතිරිල්ල මත ඉඳගනු ලබන්නේත් වයස් සීමාව අනුව යමිනි. ඔවුන් අසලින් උස් ආසනයක් තබා පිරුවටයක් එළා කෙසෙල් කොළයක් තබා බුද්ධ පූජාව හා දෙවියන් වෙනුවෙන් පළමුදානය පිළියෙල කොට පහනක් ද දල්වයි.

කිරි අම්මාවරුන් සඳහා පිළියෙළ කළ කිරිබත්, කිරියා, කෙසෙල් ගෙඩි හා අනෙකුත් ද්‍රව්‍ය කෙසෙල් කොළයක තබා ඉදිරියේ තබනු ලබයි. පඬුරු ද තබා පහනක් ද දල්වයි. පහනට තිර දෙකක් දමා දල්වති. ගෘහිණිය මෙහිදී දෙවියන්ට ආරාධනා කොට කිරි මවුවරුන්ට දානය පිළිගන්වයි. එම දානය සතුටු සිතින් ගන්නා වූ කිරි අම්මාවරු පත්තිනි යාදින්න කියවා නිවසටත් නිවැසියන්ටත් සුබ ආශිර්වාද කරයි. එසේ ආශීර්වාද කරමින් රෝගීන් හෝ ගෙදර අය කිරි අම්මාවරු ඉදිරියට කැඳවා පහන්වැටි හත එකට දල්වා සඳුන් කිරි පැණි සහ තනකිරි මුසු කිරි බඳුනකට දමමින් ගිගිරි සලඹක් නද කරමින් සෙත් ශාන්ති කරනු ලබයි.

ඔසිරිපොටක් ගෙන කරට දමාගෙ න
සළු පොටකින් මිණි සළඹ වසාගෙ න
දළුමුර කරඬුව අතකින් අරගෙ න
එන්නයි කිරි අම්මාවරු සත් දෙ න

සමහර පළාත්වලදී කිරිදානය දීමේ වෙනස් ක්‍රමයක් ද අනුගමනය කරයි. දනට පැමිණෙන කිරි අම්මාවරු එම නිවස දොරකඩ තබා ඇති දෙහි මිශ්‍ර ජලයෙන් මුව දෝවනය කර ඇතුළු වේ. කිරි අම්මලා 7ක් සිටිය යුතු ය. ඊට වැඩි වන්නේ නම් 14, 21, 28 සංඛ්‍යාවක් විය යුතු ය. කිරි දානය කැවුම් කිරිබත් කෙසෙල් ගෙඩි අලුවා තැබිය යුතු ය. දානය සඳහා අනිවාර්යයෙන්ම හාල් කිරි කිරියා තිබිය යුතුමය. දානය පිරිනමනු ලබන්නේ අලුයම 4 ත් 6 කාලයේ දී ය. වර්තමානයේ දී බොහෝ නිවෙස්වල කිරි දානය ලබාදීමේ දී කැවුම් කිරිබත් (අතිරස) කෙසෙල්ගෙඩිවලට අමතරව තලකැරලි, පලතුරු වට්ටියක් හා වෙනත් පූජා භාණ්ඩ ලබාදීමට ද පියවරගෙන ඇත. ඒ කිරි අම්මලා සතුටු කළ තරමට ලැබෙන ආශීර්වාදය ද ඉමහත් බවට පවතින විශ්වාසය මතයි.

කිරි අම්මාවරු එන කල බා ලේ
මල්වරුසාවක් වැහැපි දෙවේ ලේ
ඒ මල් අහුලා ගෙන එන වේ ලේ
කිරි අම්මා කළ ලෙඩ නැ බො ලේ

ආයුර්වේද වෛද්‍ය
**මැණික් නේරංජනා හෙට්ටිආරච්චි**

සටහන -
**එස්. එස්.එස්. ප්‍රනාන්දු**





# සත් දිනට සෙත් දෙන ග්‍රහයෝ

සතියේ දින හත ග්‍රහයන් හත් දෙනෙකුගේ බලපෑම් ලබන බව ජ්‍යෝතිෂයේද පැහැදිලි කරුණකි. ඒ අනුව ඉරිදු දින රවි ග්‍රහයාගේ ද සඳුදු දින චන්ද්‍රයාගේ ද, අඟහරුවාදු දින කුජ ග්‍රහයාගේද බදුදු දින බුධ ග්‍රහයාගේද බ්‍රහස්පතින්දු දින ගුරු ග්‍රහයාගේ ද සිකුරාදු දින සිකුරු ග්‍රහයාගේ සහ සෙනසුරාදු දින සෙනසුරු හෙවත් ශනි ග්‍රහයාගේ ද බලපෑම් ලබයි.

සිකුරාදා සිකුරු ග්‍රහයාට හිමි දවසයි. ආපෝ ධාතු ගුණයේ බලපෑම් අධිකව පවත්නා දිනය සිකුරාදාය. තමන්ට බලය ඇති අවස්ථාව පැමිණිවිට අමුතු නැටිලි, දැඟලිලි ඇතිවීම ස්වභාවිකය. එමෙන්ම සිකුරාදා දිනවල ජලයේ බලපෑම අධික හෙයින් හදිසි ජල තරංග මතුවීම, නිතර නිතර දියසුලි ඇතිවීම වැනි ජලයේ චණ්ඩභාවය වැඩි වේ.

ඉරිදා යනු අප හිරු නමින් හඳුන්වන ග්‍රහලෝකයේ රශ්මි ධාරාවන් වේගවත්ව වැඩි වශයෙන් අපේ පෘථිවියට ආකර්ෂණය වන දිනයකි. සතියේ දින අතුරින් ගොවිතැන් කටයුතු ආරම්භ කිරීමට ඉතාමත් අශුභ දිනය ඉරිදා ය.

මේ නිසා අපේ පැරැන්නෝ ගොවිතැන් කටයුතු මෙන්ම වෙනත් සුබ කටයුතු ආරම්භ කළේ නැකතට අනුව ඒ ඒ දිනයට ගැළපෙන ආකාරයෙනි. විශේෂයෙන් ගොවිතැන් කටයුතු නැකත් එම වෙලාවට එම දිනයන්හි ආරම්භ කිරීමෙන් කටයුතු වඩාත් සාර්ථක වන බව පුරාණයේ පටන් පැවත එන විශ්වාසයකි. මෙම කටයුතු සඳහා සුබ අසුබ දිනයන් මේ අයුරින් ජ්‍යොතිෂයේ ද දක්වා ඇත.

### ඉරිදා

ඉරිදු යනු අප හිරු නමින් හඳුන්වන ග්‍රහලෝකයේ රශ්මි ධාරාවන් වේගවත්ව වැඩි වශයෙන් අපේ පෘථිවියට ආකර්ෂණය වන දිනයකි. සතියේ දින අතුරින් ගොවිතැන් කටයුතු ආරම්භ කිරීමට ඉතාමත් අශුභ දිනය ඉරිදු ය. සූර්යාලෝකය යනු එකම තේජෝ ධාතු පිණ්ඩයකි. තේජෝ ධාතුව හා පඨවි ධාතුව අතර කිසිම සම්බන්ධයක් නැත. එම ධාතු ගුණත්වය එක්කිරීමෙන් කිසිම බලවේගයක් උපදවන්නට නොහැක. පොළොවට ගිනි අවුලවන්ට නොහැක්කේ ය. හිරුගේ බලපෑම අධිකතරව ඇති ඉරු දිනයන්හි ගොවිතැන් පිළිබඳව කිසිම කටයුත්තක් ඇරඹීම සුදුසු නොවන බව නක්ෂත්‍රයෙහි දක්වා ඇත්තේ ඒ නිසාම ය. ඉරිදු දිනවල වගා කිරීම පමණක් නොව වගාවන් සඳහා බිම සකස් කිරීම වැටකොටු බැඳීම වැනි කටයුතුවලින් ද වැළකීම සුදුසු ය. වගාවන් පිළිබඳ මූලික කටයුතු ඉරිදුවක ආරම්භ කළහොත් එය ආරවුලකින් හෝ අලාභයකින් අවසන්වන අසාර්ථක කටයුත්තක් ලෙස සැලකේ. මූලික ආරම්භයට මිස ඉරිදු දින වැඩ කිරීමට නුසුදුසු දිනයක් ලෙස තේරුම් නොගත යුතු ය.

### සඳුදා

සඳුදු යනු චන්ද්‍රාලෝකයේ ආකර්ෂණය පොළොවට වඩාත්ම බලපාන දිනයයි. සඳුදු දිනවල කැලෑ කෙටීම ආරම්භ නොකළ යුතු යයි ජ්‍යොතිෂයෙහි පෙන්නුම් කර ඇත. කැලේට හඳ පෑව්වා වගේ යයි කියමනක් අප අතර ඇත. කැලේට පායන හඳ එළියෙන් කිසිම ප්‍රයෝජනයක් නැති බව එයින් අඟවයි. ඝන කැලෑබදව ඇත්තේ වියළි දේශගුණයයි. වියළි කලාපයට කොපමණ සඳඑළිය වැටුණොත් එහි උෂ්ණත්වයට එයින් හානියක් සිදු නොවෙයි. කැලෑබද දේශගුණයට සඳරැස් එක්වීමෙන් කිසියම් අමුතු බලයක් උද්ගතවන බව එයින් පැහැදිලි වේ. මේ අනුව සඳුදු දිනයක කෙටීමක් අරඹා ගොවිතැන් කළහොත් නිසිකලට වැසි නොලැබීමෙන් එම ගොවිතැන් නිසරු වීමට පුළුවන. මේ හැර සඳුදු දිනයන්හි වනසිරි නැරඹීම සඳහා හෝ දඩයම් පතා වනගත විනෝද ගමන් යාම ඉතා අනතුරුදායකය. සෙල්ලමට හෝ සඳුදු දිනයක කැලෑ වැදීමෙන් විපතක් මිස සැපතක් නම් නොවේ.

### අඟහරුවාදා

අඟහරුවාදු යනු කුජ හෙවත් අඟහරු ග්‍රහයාගෙන් පෘථිවියට වැඩි බලපෑමක් ඇති දිනයයි. අඟහරු ලොව එකම ගිනි ගුළියක් ලෙස හඳුන්වයි. ගින්දර සමඟ සෙල්ලම් හොඳ නැති බව අපි අසා ඇත්තෙමු. ගින්නෙන් වැඩ ගැනීමද ඉතා ප්‍රවේශමෙන් කළ යුතු ය. ගින්දර නැතිවම බැරි නිසා නොවේනම් ගින්දර ළංකර ගැනීමට කිසිවෙකු කැමති නොවෙයි. හිරුගේ රශ්මිය අධිකව බලපාන දිනවල ගින්නේ ආධාරයෙන් හෝ ඒ ආශ්‍රයෙන් කරන කටයුතු ආරම්භ කිරීම ගින්නට පිදුරු දැමීමක් වෙයි. මේ නිසා අඟහරුවාදු දිනක ගොවිතැන් සඳහා හේන් ගිනි ලෑම හෝ විදුලිබල, කම්හල් ආදී ගිනි ආශ්‍රිත කටයුතු ආරම්භ කිරීමෙන් ඒවා කරදර හානි විපත්වලින් අවසන් වීමට හේතු වන්නේ ය.

### බදාදා

බදුදු දිනය බුධ ග්‍රහයාගේ බලපෑම් අධික දිනයයි. බුද දින හෙවත් බදුදු දින බඩු මිලට ගැනීම බඩු විකිණීම වැනි නගර ආශ්‍රයෙන් කරනු ලබන කටයුතු ආරම්භ කිරීම අයෝග්‍ය බැව් සඳහන් වෙයි. බුධ මායාකාර සොර සිත් ඇති චපල ග්‍රහයෙක් වන අතර එම ග්‍රහයාගේ අධික බලපෑම ඇති හෙයින් බදුදු දිනක වැඩුණු වගාවන් විකිණීම ආරම්භ නොකළ යුතු යයි කියා ඇත්තේ නිසි ආකාර ලෙස ගනුදෙනු බේරුම් කර ගැනීමට නොහැකි වීම, රැවටිලිවලට අසුවීම නියමමිල ලබා ගැනීමට නොහැකි වීම ආදී බාධකයන් ඇතිවන බැවිණි.

### බ්‍රහස්පතින්දා

බ්‍රහස්පතින්දු දින ගුරු ග්‍රහයාගේ බලපෑම් ලබන දිනයයි. ගුරු දිනය තුළ කඳු නැගීම, කඳු ප්‍රදේශවල වැඩ ආරම්භ කිරීම, කඳුකර ගමන් ජ්‍යොතිෂයේ තහනම්කර ඇත්තේ ගුරු තාපස ග්‍රහයෙකු නිසා ය. තවුසන්ගේ වැඩ වාසය කඳු ආශ්‍රයෙහි නිසා කඳු පෙදෙසට සාමාන්‍ය මිනිසුන් පැමිණීම ඔවුනට බාධාවක් වේ. එබැවින් ගුරුගේ වැඩි බලපෑමක් ඇති බ්‍රහස්පතින්දු දිනයේ කඳු ප්‍රදේශවල කටයුතු ආරම්භ කිරීම නුසුදුසු ය. විනෝදය සඳහාවත් ගුරු දිනවල කඳු නැගීම අන්තරාදායකය.

### සිකුරාදා

සිකුරාදු සිකුරු ග්‍රහයාට හිමි දවසයි. ආපෝ ධාතු ගුණයේ බලපෑම් අධිකව පවත්නා දිනය සිකුරාදුය. තමන්ට බලය ඇති අවස්ථාව පැමිණිවිට අමුතු නැටිලි, දැඟලිලි ඇතිවීම ස්වභාවිකය. එමෙන්ම සිකුරාදු දිනවල ජලයේ බලපෑම අධික හෙයින් හදිසි ජල තරංග මතුවීම, නිතර නිතර දියසුලි ඇතිවීම වැනි ජලයේ චණ්ඩභාවය වැඩි වේ. වාර්මාර්ග කටයුතු ආරම්භයට සිකුරාදු දින නුසුදුසු බව සඳහන් කර ඇත්තේ ඒ නිසා ය. සිකුරාදු දිය නෑම අශුභ යයි සම්මතයක්ද ඇත්තේ ඒ නිසා විය හැකි ය. දිය නෑමට හොඳම දිනය සිකුරාදු. නමුත් මුහුදේ හෝ ගංගාවල බැස දිය නෑමෙන් අනතුරු සිදුවීමට ඉඩ ඇති බැවින් එදින දිය නෑමෙන් වැළකී සිටීමට පැරණි ජනයා පුරුදු වී සිටියහ. ගංගා ආදියෙහි විනෝද ගමන් යෑමට හා ජල ක්‍රීඩාවල යෙදීමට සිකුරාදු දිනය සුදුසු නොවේ.

### සෙනසුරාදා

සෙනසුරාදු දින සෙනසුරු ග්‍රහයාට බලවත් වේ. සෙනසුරාදු දවස ගමන් බිමන් ආරම්භ කිරීමට නුසුදුසු බව පවසා ඇත්තේ සෙනසුරුගේ අපලයට අතපය කැඩීමට බොහෝ දුරට හේතුවෙන බැවිනි. කකුල් කොරවීමද සෙනසුරුගේම හපන්කමකි. මෙයින් අදහස් වන්නේ අපේ ගමන් බිමන්වලට සෙනසුරු අකැමැති බවයි. සෙනසුරුගේ බලපෑම අධික බැවින් සෙනසුරාදු දිනවල වැදගත් ගමන් බිමන්වලින් වැළකී සිටීම වැදගත් වේ. සත්දින තුළ ආරම්භ නොකළයුතු කටයුතු පිළිබඳව මෙහි සඳහන් කර ඇත්තේ පොදු හැඳින්වීමක් පමණී. ඒ ඒ දිනයන්ට නුසුදුසු විශේෂයෙන් රික්තා මර යෝග සහිත දිනවල එම කටයුතුවලින් වැළකී සිටීම වඩා වැදගත් ය.



හිඹුටානේ

**පියතිලක ද අල්විස්**

# සතියේ පඤ්චාංගය

**ශක වර්ෂ 1945ක් වූ මේෂ රවි 15 භාග වෙසක් පුර අටවක තිථිය ලත් කිවිදින සිට එම රවි 21 භාග වෙසක් පුර තුදුස්වක තිථිය ලත් ගුරු දින දක්වායි.**

## ග්‍රහයෝ සහ රාශි

රවි - මේෂ
කුජ - මිථුන
බුධ - මේෂ (වක්‍ර)
ගුරු - මේෂ
ශුක්‍ර - වෘෂභ ( 02දා දහවල් 01.51ට මිථුන)
ශනි - කුම්භ
රාහු - මේෂ
කේතු - තුලා
යුරේනස් - මේෂ
නැප්චූන් - මීන

## ග්‍රහයෝ සහ නැකැත්

රවි - අස්විද ( 28දා උදේ 06.40 බෙරණ)
කුජ - පුනාවස
බුධ - බෙරණ
ගුරු - රේවතී
ශුක්‍ර - මුවසිරස
ශනි - සියාවස
රාහු - අස්විද
කේතු - සා
යුරේනස් - බෙරණ
නැප්චූන් - උත්‍රපුටුප

## පෝය

මැයි 04 බ්‍රහස්පතින්දා රාත්‍රී 11.42න් පුර පසළොස්වක ලබා 05 සිකුරාදා රාත්‍රී 11.02න් ගෙවේ. 05 සිකුරාදා සිල්.

## චන්ද්‍ර චාරය

29දා දවල් 12.47 සිංහ
මැයි 02දා රාත්‍රී 12.21 කන්‍යා
මැයි 04දා උදේ 09.19 තුලා

## දින තත්ත්වය

**අප්‍රේල් 28 සිකුරාදා**
මේෂ රවි 15 භාග වෙසක් පුර අටවක තිථිය ලත් කිවිදින. ඉර උදාව 05.58 ඉර බැසීම 06.18 පුෂ නැකත උදේ 09.54න් ගෙවී අස්ලිස නැකත ලබයි. වෙසක් පුර අටවක තිථිය සවස 04.03න් ගෙවී පුර නවවක තිථිය ලබයි. ශූල යෝගය උදේ 09.39න් ගෙවී ගණ්ඩ යෝගය ලබයි. විෂ්ටිකරණය අලුයම 02.51න් ගෙවී බව කරණය ලබා එය සවස 04.03න් ගෙවී බාලව කරණය උදාව පවතී.
විෂ කලාව - නළල
අමෘත කලාව - තනය
මරු - ගිනිකොන
යෝගිනී - ඊසාන සුබ දිසාව - උතුර

**අප්‍රේල් 29 සෙනසුරාදා**
මේෂ රවි 16 භාග වෙසක් පුර නවවක තිථිය ලත් ශනි දින. ඉර උදාව 05.57. ඉර බැසීම 06.19 අස්ලිස නැකත දහවල් 12.47න් ගෙවී මා නැකත ලබයි. වෙසක් පුර නවවක තිථිය සවස 06.22න් ගෙවී පුර දසවක තිථිය ලබයි. ගණ්ඩ යෝගය උදේ 10.31න් ගෙවී වෘධි යෝගය ලබයි. බාලව කරණය අලුයම 05.15න් ගෙවී කෞලව කරණය ලබා එය සවස 06.22න් ගෙවී තෛතිල කරණය උදාව පවතී.
විෂ කලාව - හිස් මුඳුන
අමෘත කලාව - ගෙල
මරු - නැගෙනහිර
යෝගිනී - නැගෙනහිර සුබ දිසාව - උතුර

**අප්‍රේල් 30 ඉරිදා**
මේෂ රවි 17 භාග වෙසක් පුර දසවක තිථිය ලත් රවි දින. ඉර උදාව 05.57. ඉර බැසීම 06.19 මා නැකත සවස 03.29න් ගෙවී පුවපල් නැකත ලබයි. වෙසක් පුර දසවක තිථිය රාත්‍රී 08.28න් ගෙවී පුර එකොළොස්වක තිථිය ලබයි. වෘධි යෝගය දහවල් 11.15න් ගෙවී ධෘම යෝගය ලබයි. තෛතිල කරණය උදේ 07.29න් ගෙවී ගරජ කරණය ලබා එය රාත්‍රී 08.28න් ගෙවී වණිජ කරණය උදාවෙයි.
විෂ කලාව - හිස
අමෘත කලාව - නාසය
මරු - උතුර යෝගිනී - උතුර
සුබ දිසාව - නැගෙනහිර

**මැයි 01 සඳුදා**
මේෂ රවි 18 භාග වෙසක් පුර එකොළොස්වක තිථිය ලත් සඳු දින ඉර උදාව 05.57 ඉර බැසීම 06.19 පුවපල් නැකත සවස 05.49න් ගෙවී උත්‍රපල් නැකත ලබයි. වෙසක් පුරඑකොළොස්වක තිථිය රාත්‍රී 10.08න් ගෙවී පුර දොළොස්වක තිථිය ලබයි. ධෘම යෝගය දහවල් 11.43න් ගෙවී ව්‍යාඝාත යෝගය ලබයි. වණිජ කරණය උදේ 09.23න් ගෙවී විෂ්ටි කරණය ලබා එය රාත්‍රී 10.08න් ගෙවී බව කරණය උදාව පවතී.
විෂ කලාව - නළල
අමෘත කලාව - ඇස
මරු - වයඹ යෝගිනී - ගිනිකොන
සුබ දිසාව - නැගෙනහිර

**මැයි 02 අඟහරුවාදා**
මේෂ රවි 19 භාග වෙසක් පුර දොළොස්වක තිථිය ලත් කුජ දින. ඉර උදාව 05.57. ඉර බැසීම 06.19 උත්‍රපල් නැකත රාත්‍රී 07.39න් ගෙවී හත නැකත ලබයි. වෙසක් පුර දොළොස්වක තිථිය රාත්‍රී 11.16න් ගෙවී පුර තෙළෙස්වක තිථිය ලබයි. ව්‍යාඝාත යෝගය දහවල් 11.47න් ගෙවී හර්ෂණ යෝගය ලබයි. බව කරණය උදේ 10.47න් ගෙවී බාලව කරණය ලබා එය රාත්‍රී 11.16න් ගෙවී කෞලව කරණය උදාවෙයි.
විෂ කලාව - බැම
අමෘත කලාව - කන
මරු - බටහිර යෝගිනී - නිරිත
සුබ දිසාව - දකුණ

**මැයි 03 බදාදා**
මේෂ රවි 20 භාග වෙසක් පුර තෙළෙස්වක ලත් බුධ දින. ඉර උදාව 05.56 ඉර බැසීම 06.19 හත නැකත රාත්‍රී 08.54න් ගෙවී සිත නැකත ලබයි. වෙසක් පුර තෙළෙස්වක තිථිය රාත්‍රී 11.48න් ගෙවී පුර තුදුස්වක තිථිය ලබා පවතී. හර්ෂණ යෝගය දහවල් 11.25න් ගෙවී වජ්‍ර යෝගය ලබයි. කෞලව කරණය දහවල් 11.37න් ගෙවී තෛතිල කරණය ලබා එය රාත්‍රී 11.48න් ගෙවී ගරජ කරණය උදාව පවතී.
විෂ කලාව - කන
අමෘත කලාව - බැම
මරු - නිරිත යෝගිනී - දකුණ
සුබ දිසාව - නැගෙනහිර

**මැයි 04 බ්‍රහස්පතින්දා**
මේෂ රවි 21 භාග වෙසක් පුර තුදුස්වක ලත් ගුරු දින. ඉර උදාව 05.56 ඉර බැසීම 06.19 සිත නැකත රාත්‍රී 09.33න් ගෙවී සා නැකත ලබයි. වෙසක් පුර තුදුස්වක තිථිය රාත්‍රී 11.42න් ගෙවී පුර පසළොස්වක තිථිය ලබයි. වජ්‍ර යෝගය උදේ 10.34න් ගෙවී සිද්ධි යෝගය ලබයි. ගරජ කරණය උදේ 11.49න් ගෙවී වණිජ කරණය ලබා එය රාත්‍රී 11.42න් ගෙවී විෂ්ටි කරණය උදාව පවතී.
විෂ කලාව - ඇස
අමෘත කලාව - නළල
මරු - දකුණ යෝගිනී - බටහිර
සුබ දිසාව - නැගෙනහිර

## සතියේ ලග්න උදව

| | මේෂ අලුයම | වෘෂභ | මිථුන | කටක | සිංහ දවල් | කන්‍යා | තුලා | වෘශ්චික රාත්‍රී | ධනු | මකර | කුම්භ අලුයම | මීන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 28 ශු | 05.12 | 07.05 | 09.09 | 11.19 | 01.25 | 03.23 | 05.19 | 07.19 | 09.29 | 11.40 | 01.37 | 03.27 |
| 29 ශ | 05.09 | 07.02 | 09.06 | 11.16 | 01.22 | 03.20 | 05.16 | 07.16 | 09.26 | 11.36 | 01.34 | 03.24 |
| 30 ර | 05.06 | 06.58 | 09.02 | 11.12 | 01.18 | 03.16 | 05.11 | 07.12 | 09.22 | 11.32 | 01.31 | 03.20 |
| 01 ච | 05.02 | 06.54 | 08.58 | 11.08 | 01.14 | 03.12 | 05.07 | 07.08 | 09.18 | 11.28 | 01.28 | 03.15 |
| 02 කු | 04.58 | 06.50 | 08.54 | 11.04 | 01.10 | 03.08 | 05.03 | 07.04 | 09.14 | 11.24 | 01.24 | 03.11 |
| 03 බු | 04.54 | 06.45 | 08.50 | 11.00 | 01.06 | 03.04 | 05.00 | 07.00 | 09.10 | 11.20 | 01.20 | 03.07 |
| 04 ගු | 04.50 | 06.41 | 08.45 | 10.56 | 01.02 | 03.00 | 04.56 | 06.56 | 09.06 | 11.16 | 01.16 | 03.03 |

## කාල හෝරාව ගෙවී යන අයුරු

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 28 ශු | ශු 05.58 | බු 06.58 | ච 07.58 | ශ 08.58 | ගු 09.58 | කු 10.58 | ර 11.58 | ශු 12.58 | බු 01.58 | ච 02.58 | ශ 03.58 | ගු 04.58 | කු 05.58 |
| 29 ශ | ශ 05.57 | ගු 06.57 | කු 07.57 | ර 08.57 | ශු 09.57 | බු 10.57 | ච11.57 | ශ 12.57 | ගු 01.57 | කු 02.57 | ර 03.57 | ශු 04.57 | බු 05.57 |
| 30 ර | ර 05.57 | ශු 06.57 | බු 07.57 | ච 08.57 | ශ 09.57 | ගු 10.57 | කු 11.57 | ර 12.57 | ශු 01.57 | බු 02.57 | ච 03.57 | ශ 03.57 | ගු 04.57 |
| 01 ච | ච 05.57 | ශ 06.57 | ගු 07.57 | කු 08.57 | ර 09.57 | ශු 10.57 | බු 11.57 | ච 12.57 | ශ 01.57 | ගු 02.57 | කු 03.57 | ර 04.57 | ශු 05.57 |
| 02 කු | කු 05.57 | ර 06.57 | ශු 07.57 | බු 08.57 | ච 09.57 | ශ 10.57 | ගු 11.57 | කු 12.57 | ර 01.57 | ශු 02.57 | බු 03.57 | ච 04.57 | ශ 05.57 |
| 03 බ | බු 05.56 | ච 06.56 | ශ 07.56 | ගු 08.56 | කු 09.56 | ර 10.56 | ශු 11.56 | බු 12.56 | ච 01.56 | ශ 02.56 | ගු 03.56 | කු 04.56 | ර 05.56 |
| 04 ගු | ගු 05.56 | කු 06.56 | ර 07.56 | ශු 08.56 | බු 09.56 | ච 10.56 | ශ 11.56 | ගු 12.56 | කු 01.56 | ර 02.56 | ශු 03.56 | බු 04.56 | ච 05.56 |

## නිරයන ග්‍රහස්ඵුට

| | රවි මේෂ | සඳු කටක | කුජ මිථුන | බුධ මේෂ | ගුරු මීන | ශුක්‍ර වෘෂභ | ශනි කුම්භ | රාහු මේෂ | යුරේනස් මේෂ | නැප්චූන් මීන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 28 ශු | 13.18.21 | 14.44.15 | 23.11 | 19.31 | 01.27 | 25.09 | 11.00 | 09.49 | 24.05 | 02.28 |
| 29 ශ | 14.16.41 | 26.37.26 | 23.44 | 18.59 | 01.41 | 26.16 | 11.05 | 09.46 | 24.08 | 02.30 |
| | | සිංහ | | | | | | | | |
| 30 ර | 15.15.00 | 08.33.52 | 24.17 | 18.23 | 01.55 | 27.24 | 11.09 | 09.43 | 24.11 | 02.32 |
| 01 ච | 16.13.13 | 20.37.54 | 24.50 | 17.46 | 02.09 | 28.31 | 11.13 | 09.40 | 24.15 | 02.33 |
| | | කන්‍යා | | | | | | | | |
| 02 කු | 17.11.27 | 02.53.32 | 25.23 | 17.08 | 02.24 | 29.38 | 11.18 | 09.37 | 24.18 | 02.35 |
| | | | | | | මිථුන | | | | |
| 03 බු | 18.09.40 | 15.23.56 | 25.56 | 16.28 | 02.38 | 00.45 | 11.22 | 09.34 | 24.22 | 02.37 |
| 04 ගු | 19.07.51 | 28.11.24 | 26.29 | 15.50 | 02.52 | 01.52 | 11.26 | 09.30 | 24.25 | 02.39 |

සැකසීම
සංජීව
අඹුවන්ගල




**අප්‍රේ. 28 සිකුරාද සිට මැයි 04 වන බ්‍රහස්පතින්ද දක්වා වූ සතිය තුළ දී උපදින දු පුතුන් හට සුබ නාමාක්ෂර පහත පරිදි ගළපා නම් තබන්න.**

### 28 කිවිද

මෙදින උදේ 09.54 දක්වා පුෂ නැකත උදාව පවතින නිසා හෙ, හො, ඩ අකුරුත් ඉන්පසුව උදාවන අස්ලිස නැකතට හිමිවන ඩි, ඩු, ඩෙ, ඩො අකුරුත් දිනයට සුදුසු වන ච, ඡ, ජ අක්ෂරත් ගළපා නම් තබන්න.

### 29 ශනිද

දහවල් 12.47 දක්වා අස්ලිස නැකත උදාව පවතින නිසා ඩි, ඩු, ඩෙ, ඩො අකුරු හා ඉන්පසුව උදාවන මා නැකතට හිමිවන ම, මි, මු, මෙ අකුරුත් දිනයට සුදුසු වන ප, බ, භ, ම අක්ෂරත් ගළපා නම් තබන්න.

### 30 රිවිද

මෙදින සවස 03.29 දක්වා මා නැකත උදාව පවතින නිසා ම, මි, මු, මෙ අකුරු හා ඉන්පසුව උදාවන පුවපල් නැකතට හිමිවන ටො, ට, ටි, ටු අකුරුත් දිනයට සුදුසු අකුරු වන අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ අක්ෂරත් සුබදායකය.

### 01 සඳුද

සවස 05.49 දක්වා පුවපල් නැකත උදාවන නිසා මො, ට, ටි, ටු අකුරු හා ඉන්පසුව උදාවන උත්‍රපල් නැකතට හිමිවන ටෙ, ටො, ප, පි අකුරුත් දිනයට සුදුසු ය, ර, ල, ව, ස, හ, ශ, ෂ අක්ෂරත් සුදුසු වේ.

### 02 කුජද

මෙදින රාත්‍රී 07.39 දක්වා උත්‍රපල් නැකත උදාව පවතින නිසා ටෙ, ටො, ප, පි අකුරු හා ඉන්පසුව උදාවන හත නැකතට හිමිවන පු, ෂ, ණ අකුරුත් දිනයට සුදුසු වන ක, ඛ, ග, ඝ අක්ෂරත් ගළපා නම් තබන්න.

### 03 බුධද

මෙදින රාත්‍රී 08.54 දක්වා හත නැකත උදාවන නිසා පු, ෂ, ණ අකුරුත් ඉන්පසුව උදාවන සිත නැකතට හිමිවන පෙ, පො, ර, රි අකුරුත් දිනයට සුදුසු ට, ඩ, ණ අක්ෂරත් සුබදායකය.

### 04 ගුරුද

මෙදින රාත්‍රී 09.33 දක්වා සිත නැකත උදාවන නිසා පෙ, පො, ර, රි අකුරුත් ඉන්පසුව උදාවන සා නැකතට හිමිවන රු, රෙ, රො, ත අකුරුත් දිනයට සුදුසු වන ත, ද, ධ, න අක්ෂරත් ගළපා නම් තබන්න.

## ග්‍රහ දෘෂ්ටි

21 කිවිදා
උදේ 10.08 ච, තු, ෂඩ්
දහවල් 01.37 ච, බු, සං
23 රිවිදා
රාත්‍රී 12.31 ච, ශ, චතු
සවස 06.14 ච, ශු, සං
24 සඳුදා
උදේ 08.50 බු, කු, ෂඩ්
දවල් 02.20 ච, ගු, ෂඩ්

25 කුජදා
උදේ 09.42 ර, ච, ෂඩ්
උදේ 10.11 ච, ශ, ත්‍රි
සවස 04.19 ර, ශ, ෂඩ්
26 බුධදා
අලුයම 05.18 ච, බු, ෂඩ්
උදේ 08.39 ච, කු, සං
27 ගුරුදා
අලුයම 02.40 ච,ගු, චතු

## සුබ දවස්

21දා රාත්‍රී 11.04න් පසු සුබයි
22දා මුළු දවසම සුබයි
23දා උදේ 07.51 දක්වා සුබයි
25දා උදේ 09.44න් පසු සුබයි
26දා දහවල් 11.31න් පසු සුබයි
27දා උදේ 08.48 දක්වා සුබයි

## රාහු කාලය

28 ශු උදේ 10.35 - 12.08 රාත්‍රී 10.40 - 12.08
29 ශ උදේ 09.02 - 10.35 රාත්‍රී 09.13 - 10.41
30 ර සවස 04.46 - 06.19 අලුයම 04.29 - 05.57
මැයි 01 ච උදේ 07.29 - 09.03 රාත්‍රී 07.46 - 09.14
02 කු සවස 03.13 - 04.46 අලුයම 03.01 - 04.29
03 බු දහවල් 12.07 - 01.40 රාත්‍රී 12.07 - 01.35
04 ගු දහවල් 01.40 - 03.13 අලුයම 01.34 - 03.02

# මේ සතියේ ඔබට

අප්‍රේ. 28 සිට මැයි 04 දක්වා

ධම්මිකා රාජපක්ෂ

## මේෂ — අමතර මුදල් වැයවීමක්

වෙනදාට වඩා ලැබීම් අතින් යහපත් සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 4, 5, 6 යන භාවස්ථානවලයි. හිතුවක්කාර තීරණයක් හේතුවෙන් පවුලේ අයගේ දෝෂාරෝපණයට ලක්කරන කාලයකි. තීන්දු තීරණ ගැනීමේ දී දුරදිග සිතා බලන්න. ගේ දොර අලංකාරය වෙනුවෙන් වෙහෙසෙන කාලයක් වන අතර, පවුලේ අයගේ සුහදතාවයට ද හේතු සැලසෙන බවක් පෙන්නුම් කරයි. සතිය මැද කාලයේ දී අමතර මුදල් වැයවීමක් සිදුවන අන්දමේ කටයුත්තක් සිදුකරයි. නොසිතූ ලෙස රැවටිලිවලට හසුවීමට ඉඩ ඇති කාලයක් බැවින් කල්පනාකාරී වන්න.

**අය 06 - වැය 03** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 04** — **සුබ දවස - බදාදා**

## වෘෂභ — රැකියාවේ නොසන්සුන්කාරී බවක්

වෙනදාට වඩා ලැබීම් අතින් යහපත් සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන 3, 4, 5 යන භාවයන් මතින් සිදුවෙයි. ගේ දොර උත්සව අවස්ථාවක් වෙනුවෙන් සැලසුමක් සකස්වන සතියකි. නිතර ගත සිත වෙහෙසා කරන කටයුතු අධික කරයි. පවුලේ වැඩිහිටියකු සමඟ ඇතිවන ගැටලුකාරී බවක් දුරදිග යාමට ඉඩ ඇත. සතිය මැද කාලයේ දී රැකියාවේ කටයුතු සම්බන්ධ වෙනදාට වඩා නොසන්සුන්කාරී බවක් ඇති කරයි. එමෙන්ම ගේ දොර කටයුතු පිළිබඳව අධික වෙහෙසවීම් ඇති කරයි. සති අන්තය වන විට දී මෙතෙක් ප්‍රමාදවෙමින් පැවැති මුදල් හිමිකමක් සම්බන්ධ බලාපොරොත්තුවක් ඉටු කරයි.

**අය 07 - වැය 05** — **ජය වර්ණය - කොළ**
**ජය අංකය - 09** — **සුබ දවස - බ්‍රහස්පතින්දා**

## මිථුන — සැලසුම්වල ප්‍රමාදයක්

වෙහෙසකාරී කටයුතු කීපයකට සම්බන්ධ වෙමින් පවතින සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 2, 3, 4 යන භාවස්ථානවලයි. හදිසි මුදල් ලැබීමකට හිමිකම් ඇති සතියකි. අමතර ගමන් කීපයක් ද යෙදෙන බවක් පෙන්නුම් කරයි. නිතර මඟතොට හමුවන කෙනකු නිසා කරදරකාරී බවක් ඇති කරයි.

සතිය මැද කාලය වන විට දී වරින් වර ඇතිකරන උදරාශ්‍රිත ආබාධයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවෙයි. සැලසුම් කීපයක් ප්‍රමාද කරන සතියක් වන අතර, පවුලේ කටයුතු පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන බවක් ද පෙන්නුම් කරයි.

**අය 06 - වැය 05** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 04** — **සුබ දවස - සඳුදා**

## කටක — රැකියා ලාබ හිමිකම්

අවිවේකී වුවත් සැළසුම් කීපයක් සාර්ථක කර ගැනීමට හැකිවන සතියක් වන අතර, මේ සතිය ආරම්භය ඔබට මිශ්‍ර ඵලදායක බවක් පෙන්නුම් කරයි. සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 1, 2, 3 යන භාවස්ථානවලයි. ගේ දොර කටයුතු කෙරෙහි වෙනදාට වඩා උනන්දුවක් දැක්විය යුතු කාලයකි. එමෙන්ම පදිංචි ස්ථානයේ වෙනසක් කිරීමට ද සිදුවන බවක් පෙන්නුම් කරයි. ගනුදෙනුවක් පියවා ගැනීමට නීති පිහිට පැතීමට සිදුවෙයි. හිතුමතයට තීරණ ගැනීමෙන් පාඩු කීපයක් සිදුකරයි. සති අන්තයේ දී වගකීම් කීපයක් මඟහැරී යන කාලයකි. රැකියා ලාබ හිමිකම් ඇති කාලයක් බැවින් ඒ පිළිබඳ අවධානයෙන් පසුවන්න.

**අය 07 - වැය 03** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 09** — **සුබ දවස - බ්‍රහස්පතින්දා**

## සිංහ — දේපළ ගැටලුවක්

මනසට පීඩාකාරී සිතිවිලි ඇතිකරන කාලයක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයා 12, 1, 2 යන භාවයන් මතින් ගමන් කරයි. සහෝදරයන් සමඟ ඇතිවන සිත් නොහොඳකමක් දුරදිග යන ලකුණු පෙන්නුම් කරයි. එමෙන්ම පරම්පරාගත දේපළක් සම්බන්ධ ගැටලුවකට මුහුණපෑමට සිදුවෙයි. ගේ දොර අඩුපාඩු කීපයක් මඟහැරී යන කාලයකි. හදිසියේ හට ගන්නා පාදයේ වළලුකර ආශ්‍රිත ආබාධයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවෙයි. එමෙන්ම හදිසි වැටීම් තැලීම් වැනි අනතුරුදායක තත්ත්වයකට මුහුණපෑමට ඉඩ ඇති බැවින් කල්පනාකාරී වන්න.

**අය 07 - වැය 05** — **ජය වර්ණය - නිල්**
**ජය අංකය - 04** — **සුබ දවස - සඳුදා**

## කන්‍යා — වාහන ලාබයක්

ගේ දොර කටයුතු පිළිබඳ වෙනස්කම් කීපයක් සිදුකරන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 11, 12, 1 යන භාවයන් මතිනි. ඉක්මන් කලබලකාරී ගතිපැවැතුම් තමාට අවාසිදායක තත්ත්වයක් ඇති කරන සතියකි. තීරණ ගැනීමේ දී දුරදිග සිතා බලන්න. නැති වූ දෙයක් නැවත හිමිවන ලකුණු පෙන්නුම් කරයි. ආගමික සැලසුමක් වෙනුවෙන් වෙහෙසවීමට සිදුවේ. සතිය මැද කාලයේ දී කල්ගත වූ අසනීපයකින් සුවය හිමිකරයි. අමතර ආදායම් මාර්ගයකට හිමිකම ඇති කාලයකි. යටපත් වූ සෙම් රෝගයක් නැවත මතු කරයි. වාහන ලාබයකට හේතු ඇති කරයි.

**අය 07 - වැය 03** — **ජය වර්ණය - කහ**
**ජය අංකය - 04** — **සුබ දවස - බදාදා**

## තුලා — ශරීර සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වන්න

පවුලේ කටයුතු පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්විය යුතු සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 10, 11, 12 යන භාවයන් මතිනි. වෙනදාට වඩා ඇවිදිලි වැඩිවන අන්දමේ කටයුතු කීපයක් යෙදේ. නිතර දරුවකුගේ කටයුතු පිළිබඳ විමසිලිමත් වන්න. ශාස්ත්‍රීය කටයුත්තක් වෙනුවෙන් වෙහෙසීම් ඇති කරයි.

සතිය මැද කාලයේ දී දරුවකුගේ හිතුවක්කාර තීරණයක් හේතුවෙන් නිතර සිත්තැවුල් ඇති කරයි.

වෙනදාට වඩා තම ශරීර සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වීම වැදගත් වේ.

**අය 06 - වැය 04** — **ජය වර්ණය - කහ**
**ජය අංකය - 02** — **සුබ දවස - සඳුදා**

## වෘශ්චික — කොන්දේ වේදනාවක්

අවිවේකී ලෙස උදාවන මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 9, 10, 11 යන භාවයන්මතිනි. විශ්වාසය බිඳවැටීමක් හේතුවෙන් සිතේ නොසන්සුන්තාවයක් ඇති කරයි. නිතර මවු පාර්ශවයේ ඥාතියකු පිළිබඳ විමිසිලිමත් වන්න. වෙනදාට වඩා පින්දහම් කටයුතුවලට සම්බන්ධ වන කාලයකි.

විශ්වාසවන්ත කෙනකුගේ හමුවීමක් සිදුවීමට ඉඩ ඇත. සතිය මැද කාලයේ දී වරින් වර මතු කරන කොන්දේ වේදනාවකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ.

සති අන්තයේ දී නිතර නිවෙසට යන එන අය පිළිබඳ සැළකිලිමත් වන්න.

**අය 06 - වැය 04** — **ජය වර්ණය - තැඹිලි**
**ජය අංකය - 03** — **සුබ දවස - බ්‍රහස්පතින්දා**

## ධනු — ඥාති උපකාරයක්

ශාරීරික වෙහෙසවීම් වැඩි කරන සතියක් වන අතර මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 8, 9, 10 යන භාවස්ථානවලයි. වරින් වර අමතර වියදම් වැඩිවන අන්දමේ කටයුතු කීපයක් යෙදෙන අතර, ගේ දොර කටයුතුවල වෙනස්කම් කීපයක් ද සිදුකරයි. නිතර තම ශරීර සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් විය යුතු කාලයකි. පවුලේ අය සමඟ ඇතිවන මත ගැටුමක් සමතයකට පත්වන බවක් පෙන්නුම් කරයි. සතිය මැද කාලයේ දී දුර ගමනකට කටයුතු සැලසෙන කාලයක් වන අතර, විදෙස් ගත ඥාතියකුගෙන් උපකාරයක් ද හිමි කරයි. වෙනදාට වඩා ආගමික භක්තියෙන් කටයුතු කරන කාලයකි.

**අය 06 - වැය 04** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 04** — **සුබ දවස - සිකුරාදා**

## මකර — ශාරීරික වෙහෙස මහන්සිය

පවුලේ කටයුතු පිළිබඳ වෙනදාට වඩා සොයාබැලීමක් කළයුතු සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 7, 8, 9 යන භාවයන් මතිනි. මෙතෙක් ප්‍රමාදතා සිදුකළ විවාහ යෝජනාවක් සාර්ථකවන ලකුණු පෙන්නුම් කරයි. එමෙන්ම පවුලේ අය හා එකමුතුව කටයුතු කිරීමට සිදුවන සතියකි. පවුලේ වැඩිමහල් දරුවකු පිළිබඳ වෙනදාට වඩා සැලකිලිමත් වන්න. මවට හෝ මවුපස ඥාතියකුට ඇතිවන අසනීපකාරී බවක් හේතුවෙන් රෝහල්ගතවීමක් සිදුකරයි. නිතර ශාරීරික වෙහෙස මහන්සිය සිදුකරන කාලයකි. විදෙස් ලැබීමක් පිළිබඳ බලාපොරොත්තුවක් කල්දැමීමට සිදුවේ.

**අය 07 - වැය 04** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 09** — **සුබ දවස - බ්‍රහස්පතින්දා**

## කුම්භ — දරුවකු පිළිබඳ සතුටක්

මෙතෙක් පැවැති ගනුදෙනුවකින් නිදහස්වීමට කටයුතු සැලසෙන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 6, 7, 8 යන භාවයන් මතිනි. පැවැති අසනීපකාරී බවකින් නිදහස්වීමට මඟ සැලසේ. ආගමික සැලසුමක් වෙනුවෙන් වෙහෙස මහන්සිවීමට සිදුවෙයි. නිතර තමා හමුවට එන කෙනකු නිසා පවුලේ ගැටලුවක් දුරදිග යාමට ඉඩ ඇත.

සතිය මැද කාලයේ දී හදිසි වැටීම් තැලීම් වැනි අනතුරුදායක තත්ත්වයකට මුහුණපෑමට ඉඩ ඇති බැවින් දුරදිග බලා කටයුතු කරන්න. දරුවකු පිළිබඳ සතුටට පත්විය හැකි කාලයකි.

**අය 06 - වැය 04** — **ජය වර්ණය - කහ**
**ජය අංකය - 09** — **සුබ දවස - බ්‍රහස්පතින්දා**

## මීන — හදිසි ගනුදෙනුවකට සැලසුමක්

මිශ්‍රපලදායක ලෙස උදාවන මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 5, 6, 7 යන භාවස්ථානවලයි. දරුවකුගේ ගැටලුවක් වෙනුවෙන් වෙහෙසට පත්විය හැකි සතියකි. යොදාගත් සැලසුමක් වෙනසකට ලක්කරයි.

දණහිස ආශ්‍රිත ඇතිවන ආබාධ තත්ත්වයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ. හදිසි ගනුදෙනුවකට සැලසුමක් ඇති කර ගනී. සතිය මැද කාලයේ දී පැවැති අසනීපයකින් සුවය හිමිකරයි. නිතර ගත සිත වෙහෙසවා කරන කටයුතු අධික කරන කාලයකි. සතිය අන්තයේ දී තැන්පත් ධනය වැයවන අන්දමේ කටයුතු කීපයක් යෙදේ.

**අය 06 - වැය 03** — **ජය වර්ණය - දම්**
**ජය අංකය - 04** — **සුබ දවස - බදාදා**

# 138 වසරක් සපිරෙන බොදු සලකුණ බෞද්ධ කොඩිය

1885 අප්‍රේල් මස 28 දාට යෙදී තිබුණු වෙසක් පුන් පොහොය දිනයේ දී ප්‍රථමවරට ශ්‍රී ලක් දෙරණේ ලෙළදුන් අපේ බෞද්ධ කොඩිය නිර්මාණය වී තිබුණේ බුද්ධ රශ්මිමාලාවේ එන නිල්, කහ, රතු, සුදු සහ තැඹිලි යන වර්ණ සංකලනය කිරීමෙනි. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීමත් සමඟ ශරීරයෙන් නිකුත් වූ ෂඩ් වර්ණය පදනම් කොට සකස් කරන ලද මෙම කොඩිය 1885 අප්‍රේල් මස 28 දාට යෙදී තිබුණු වෙසක් පුන් පොහොය දා කොටහේන දීපදුත්තාරාම විහාරස්ථානයේ දී ගුවනට ඔසවනු ලැබුවේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි. එදින සුබ නැකතින් ඔසවනු ලැබූ බෞද්ධ කොඩියට වසර 138 ක්ම සැපිරේ.

බුදුරැස් වර්ණය යොදා ගනිමින් නිර්මාණය කළ බෞද්ධ කොඩියේ නීල (නිල්) පීත (කහ) ලෝහිත (රතු) ඕදාත (සුදු) මාංජෙෂ්ඨ (තැඹිලි වර්ණ) ප්‍රභාෂ්වර (සියලු පාට සංකලනය) වන අතර නීල වර්ණය කරුණාවත්, මෛත්‍රියත් සාමයත් අර්ථ ගැන්වේ. කහ වර්ණය මධ්‍යම ප්‍රතිපදාව අන්තගාමීත්වයෙන් වැළකීම හා පිරිපුන් බව හැඟ වේ.

රතු පාටින් ප්‍රඥාව සදාචාරය හා උදාරත්වය පෙන්නුම් කෙරේ. සුදු පාටින් ධර්මයේ පරිශුද්ධ බව හා නිදහස අර්ථ ගැන්වේ. තැඹිලි පාටින් ප්‍රඥාව හා බෞද්ධ දේශනයන් අර්ථදැක්වේ. පාට පහේ තීරුවෙන් දක්වා ඇත්තේ එකම සත්‍යයක් බවයි.

එමෙන්ම ස්වභාවිකව අප රටේ වැවෙන මල් වර්ග කීපයකටද බෞද්ධ කොඩියේ වර්ණ ගළපා ඇත. නිල් පාට නිල් මානෙල් මලටද, පීත කිනිහිරියා මලට ද, ලෝහිත වද මලට ද ඕදාත ඉද්ද හා සමන්මල්වලට ද ගළපා ඇත. බෞද්ධ කොඩියේ ආරම්භය පිළිබඳ බොහෝ විද්වතුන් පොත්පත්වලට කරුණු දක්වා තිබුණේ එහි ඇති වටිනාකම හෙළිදරව් කරමිනි. මේ අතර හඟුරන්කෙත ධීරානන්ද නාහිමි ඇතුළු හිමිවරුන් ද බෞද්ධ කොඩිය පිළිබඳව ඉතිහාසය මැනවින් දක්වා තිබුණි. 1873 දී පැවැත් වූ පානදුරාවාදය බෞද්ධ ප්‍රබෝධයේ මූලික අඩිතාලම වූවාට කිසිදු සැකයක් නැත. එනම් එම වාදය පිළිබඳ කරුණු ඉංග්‍රීසි බසින් විදෙස්රටවලද ගියේ ය. එහිදී ඉන් එක් පිටපතක් දුටු ඉංග්‍රීසි ජාතික විද්වතෙකු වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා වැඩිදුරටත් කරුණු අවබෝධ කර ගැනීම සඳහා වර්ෂ 1800 දී ශ්‍රී ලංකාවට පැමිණියේ ය.

එහිදී මහ සඟරුවන හමුවී බොදු දහම ගැන කරුණු කතා බස්කොට පැහැදී තිසරණ පන්සිල් සමාදන්ව බොදු දහම වැලඳ ගත්තේ ය. අනතුරුව එතුමා හික්කඩුවේ ශ්‍රී සුමංගල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද යන හිමිවරුන්ගේ අනුශාසකත්වය ඇතිව බෞද්ධ ප්‍රභූන් රැසක් කැඳවා සමිතියක් පිහිටුවා බොදු දහමේ ආරක්ෂාවට දැඩි මෙහෙයක් ඉටු කළේ ය. බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම සඳහා පත් කරන ලද කමිටුවට හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමි ඇතුළු හෙන්රිස්ටීල් ඕල්කට්, දොන්ඩේවිඩ් හේවා විතාරණ, ඒ.ඊ. ගුණවර්ධන, විලියම් ද ආබෲ, සී. පූජිත ගුණවර්ධන, චාල්ස් ඒ. ද. සිල්වා, ඇන්. ඇම්. ප්‍රනාන්දු ආදී ප්‍රභූන් රැසක්ම කමිටුවට ඇතුළත් කොට තිබුණි.

මෙසේ නිර්මාණය වූ බෞද්ධ කොඩිය වර්තමානයට ගැළපෙන ආකාරයෙන් සංශෝධනය කොට සකස් කරන ලද්දේ කර්නල් ඕල්කට්තුමාගේ උපදෙස් පරිදිය. එසේ නිර්මාණය වූ බෞද්ධ කොඩිය 1885 අප්‍රේල් මස 28 දාට යෙදුණු වෙසක් පසළොස්වක් පෝය දිනයේදී යෙදී තිබුණු සුබ මොහොතින් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් අතින් කොටහේන දීපදුත්තාරාම විහාරස්ථානයේදී ඔසවන ලදී. එදිනම එම බෞද්ධ කොඩිය කොළඹ විද්‍යෝදය පිරිවෙන කැලණිය රජමහා විහාරය කොළඹ කොටුවේ පරමවිඥානාර්ථ බෞද්ධ සංගමය හුණුපිටියේ ගංගාරාමය යන ස්ථානවලද ඔසවන ලදී. පසුව මෙම බෞද්ධ කොඩිය අන්තර් ජාතික බෞද්ධ කොඩිය ලෙස ලෝක බෞද්ධ සම්මේලනය විසින් 1952 දී පිළිගත් අතර එම බෞද්ධ කොඩිය එකල රටවල් හැටකට වඩා (60) පිළිගත් ධජයක් ලෙස බෞද්ධ උත්සවවලදී ඔසවනු ලැබී ය.

ප්‍රධාන ආයුර්වේද වෛද්‍ය
**සුමිත් රාජපුර**

සටහන - මාධ්‍යවේදී
**බී.ඇල්. ප්‍රේමරත්න**



බුදුරැස් වර්ණය යොදා ගනිමින් නිර්මාණය කළ බෞද්ධ කොඩියේ නීල (නිල්) පීත (කහ) ලෝහිත (රතු) ඕදාත (සුදු) මාංජෙෂ්ඨ (තැඹිලි වර්ණ) ප්‍රභාෂ්වර (සියලු පාට සංකලනය) වන අතර නීල වර්ණය කරුණාවත්, මෛත්‍රියත් සාමයත් අර්ථ ගැන්වේ. කහ වර්ණය මධ්‍යම ප්‍රතිපදාව අන්තගාමීත්වයෙන් වැළකීම හා පිරිපුන් බව හැඟවේ.







# මාතෘ සංරක්ෂණය

ගැබ් දරන කාලය තුළ කාන්තාවක් ශාරීරික හා මානසික වෙනස්කම් රාශියකට භාජනය වේ. මෙම වෙනස්කම් සුළු ආබාධ හෝ අපහසුකම් විය හැක. එය රෝග අවස්ථාවක් ලෙසට සැලකිය යුතු නොවේ. එසේ වුවද එම සුළු ආබාධ පාලනය කළ යුතු අවස්ථා ඇත. ඒවා මොනවාදැයි දැනුවත්වීම මවගේ ද උපදින දරුවාගේ ද සුරක්ෂිතභාවය සඳහා ප්‍රයෝජනවත් වේ. මාතෘ සංරක්ෂණය යනුවෙන් අදහස් වන්නේ ඒ සඳහා උපදෙස් පිළිපැදිය යුතු දේවල් මඟින් මවගේ හා ගැබ තුළ සිටින දරුවාගේ නිසි ආරක්ෂාව හා පෝෂණය ලබා දීමයි.

## ගැබිනි අවස්ථාවේ සාමාන්‍ය ලක්ෂණ

ක්‍රමානුකූලව මාස් ශුද්ධිය සිදුවන කාන්තාවකට හදිසියේ එය නතර වීම

උදෑසන වමනය, ඔක්කාරය, අරුචිය , නිතර මුත්‍රා පහවීම යනාදිය ඇතිවීම

## ගැබිනි කාලය තුළ ඇති විය හැකි විශේෂ රෝග ලක්ෂණ

ලේ හිඟකම

මුත්‍රා සමඟ ඇල්බියුමින් පිටවීම

අධික රුධිර පීඩනය

පාදවල ඉදිමුම

මෙම අවස්ථාවේ කල් වේලා ඇතිව වෛද්‍ය ප්‍රතිකාර හා උපදෙස් තදින්ම පිළිපැදිය යුතුය. එම අවස්ථා නොසලකා හැරීමෙන් දරුවා බිහිවීමේදී මවට හා දරුවාට භයානක අනතුරු සිදු විය හැකිය.

## නීරෝගී මවක් දරුවකු ලැබීමට පිළිපැදිය යුතු උපදෙස්

ගැබිනි කාලය තුළ මනා සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍යයෙන් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව දැනුමක් තිබිය යුතුය. දරුවාගේ වර්ධනය මව ගන්නා ආහාර මත සිදුවන බැවින් පෝෂ්‍යදායි සමබල ආහාරයක් නොඅඩුව ලැබිය යුතුය. එමඟින් මවගේද දරුවාගේද නීරෝගී බව ප්‍රසූත අවස්ථාවේදී ද ප්‍රසූතියෙන් පසු කාලයේදී ද කිරි දීමේදී ප්‍රයෝජනවත් වේ. දරුවාගේ වර්ධනයටද මවගේ ශරීර ශක්තියටද බිහිවීමේදී අධික ලේ වහනයක් ඇති වුවහොත් එයටද ප්‍රමාණවත් ලේ ප්‍රමාණයක් මව සතුව තිබීමට මෙම ආහාර අත්‍යවශ්‍ය වේ. එබැවින් මව පෙරට වඩා පෝෂ්‍යදායි ආහාර වැඩි ප්‍රමාණයක් ගත යුතුය.

විශේෂයෙන් අලුත් එළවළු හා පලතුරු, පලා වර්ග, ධාන්‍ය වර්ග, මාළු, මස්, බිත්තර, රතු කැකුළු හාල් බත්වලින් ආහාරය සම්පූර්ණ විය යුතුය.

උදෑසන ආහාරය සඳහා රතු කැකුළු හාල් දමා සාදාගත් කොළ කැඳ වර්ග, මුං ඇට, කඩල වැනි ධාන්‍ය වඩා යෝග්‍ය වේ. මවකට උදෑසන ආහාරය සඳහා පාන්, ඉඳිආප්ප, වැනි පිටි ආහාරවලට වඩා කොළ කැඳවලින් බඩගින්න ඇතිවීම ආහාර රුචිය ඇතිවීම, මලබද්ධය වැළැක්වීම ලේ නිපදවීම, වැඩිකිරීම යන ප්‍රයෝජන ලැබේ. මුල් මාසවලදී ආහාර අප්‍රසන්න බව හා කටට කෙළ ඉනීම නිසා මවුවරු අධික ඇඹුල් වර්ග අච්චාරු, විනාකිරි වැනි තීක්ෂණ උෂ්ණ ආහාර ගනී. ඒවා ගැනීමෙන් මුත්‍රා දාහය දරුවාට රත ගාය, රත කුෂ්ඨ වැනි චර්ම රෝගවලට හේතු විය හැක. හැකි තරම් ඒවායින් වැළකීම සුදුසුය. එහෙත් අලුත් පලතුරු වර්ග කෑම ගුණදායකය.

## ජලය පානය

පිරිසුදු ජලය හැකි තරම් පානය කිරීමෙන් වකුගඩුවල මනා ක්‍රියාකාරීත්වය හා ශරීරයේ අපද්‍රව්‍ය මුත්‍ර මඟින් බැහැර වීම සිදුවේ. මේ දිනවල පවතින අධික රස්නයට ද එය පිළියමකි. අවම දිනකට ලීටර් 3-4 ක් ජලය පානය කරන්න. ඉන් මල බද්ධයද මුත්‍රා ආබාධද වැළැක්වේ.

## පිරිසුදු වාතය

මවගේ ලේ මඟින් යන පිරිසුදු වායුව ශරීරයේ වැඩීමට ආධාර වන බැවින් මව හොඳ වාතාශ්‍රයක් ඇති පරිසරයක සිටිය යුතුය. දූෂිත පරිසරයක විෂ වායු ශ්වසනය නිසා විෂ ශරීර ගත වීමෙන්ද දරුවාට හානි විය හැකිය.

## ව්‍යායාම

ගැබිනියක් තමාගේ සුපුරුදු දෛනික කටයුතු කිරීමේ වරදක් නැත. එමඟින් මවගේ ශරීරයේ මාංශපේශින්ගේ ක්‍රියාකාරීත්වය දරුවා ප්‍රසූත කිරීමේ ක්‍රියාවලියේදී උපකාරි වේ. ව්‍යායාම කිරීම එක් එක් කාන්තාවගේ එදිනෙදා වැඩ රාජකාරි අනුව සිදුකළ යුතුය. කාර්යාලයක ඉඳගෙනම වැඩ කරන අය ඇවිදීම, දිගහැරීම, අතු ගෑම වැනි දේ ව්‍යායාම වශයෙන් කළ යුතුය. එහෙත් අධික මහන්සිය ගෙන දෙන දුර ගමන් යෑම, කඳු නැඟීම, යතුරු පැදිවල යෑම, බයිසිකල් පැදීම වැනි ව්‍යායාම නොකළ යුතුය.

## පෞද්ගලික සෞඛ්‍යය

ගැබිනිය සාමාන්‍ය අයට වඩා පෞද්ගලික සෞඛ්‍යය ගැන උනන්දු විය යුතුය. මේ කාලය තුළදී රෝගවලට භාජනය වීම උපදින දරුවාටද බලපානු ඇත. විශේෂයෙන්ම ලිංගාශ්‍රිත ප්‍රදේශය නිතර තෙත් ස්වභාවයක් පවතින බැවින් රෝග බීජ ඇතුළුවීමට ඇති ඉඩකඩ වැඩිය.

එම ප්‍රදේශය නිතර සෝදා පිරිසුදුව තැබිය යුතුය. පියයුරුවලද දියර ගැලීම් හා පියයුරු පිපිරීම් සිදුවන බැවින් ද එම ප්‍රදේශය ගැන විශේෂ සැළකිල්ලක් දැක්විය යුතුය. දිනපතා නෑම කළ යුතුය. පිරිසිදු සැහැල්ලු ඇඳුම් ඇඳීම විශේෂයෙන්ම වැදගත්ය. අඩි උස සපත්තු හොඳ නැත.

## විවේකය හා නින්ද

විවේකය හා නින්ද අත්‍යවශ්‍යයි. ඒ සඳහා සිත තුළ සහනය තිබිය යුතුය. මානසික අසහනය ඇති අයට නින්ද නොයෑම හේතුවෙන් නොයෙකුත් බලපෑම් ඇති විය හැකිය. එසේම මානසික සතුට ද විවේකය ද අත්‍යවශ්‍යයි. ඒ සඳහා ආගමික කටයුතුවල යෙදීම මානසක අසහනයන්ට ගොදුරු නොවන පරිසරයක සිටීමත් අවශ්‍ය වැදගත් කරුණු වේ. නින්දට යාමට පෙර බර ආහාර ගැනීම නින්දට බාධා කරන අතර, දිරවීමේ ක්‍රියාවලියටද බාධා කරයි.

## මුඛ සෞඛ්‍යය

මේ කාලයේදී දන්ත සෞඛ්‍යය පිළිබඳවද සැළකිලිමත් විය යුතුය. දත් දිරායාමත් කෙස් ගැලවී යාම යන ලක්ෂණ පහළ වන බැවින් ආහාරයේ කැල්සියම් අඩංගු වීම අවශ්‍යයි. දත් කුහර ඇති නම් ඒවා ආසාදනය වීමට ඉඩකඩ ඇති හෙයින් දන්ත වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ප්‍රතිකාර ලබාගත යුතුය.

## මාතෘ සායනයට යෑම

විශේෂයෙන්ම නියමිත කාලයන් තුළදී සායනයට යෑමෙන් ශරීරයේ බර, මල මුත්‍රා, ලේ ගර්භයේ තත්ත්වය පරීක්ෂා කර ගැනීමෙන් ප්‍රසවයකදී විය හැකි අනතුරු වළක්වා ගත හැකිය.

විශේෂයෙන්ම නියමිත ප්‍රසව දිනයට සූදානම් වීම ගැබිනිය විසින් සැළසුම් කළ යුතුය. නියමිත දිනයට ප්‍රසවය සිදුවන ලකුණු නොමැති වීම හෝ දරුවාගේ  චලනය අඩු වීම හෝ නැවතීම හදිසි ලේ වහනයක් හෝ දියර ගැලීමක් හෝ ඇති  නම් වහාම රෝහල කරා යා යුතු බව මව විසින් දැනගත යුතුය.

## මෙම කරුණුවලදී වෛද්‍ය උපදෙස් ගත යුතු අවස්ථා කවරේද?

ගැබිනි මුල් කාලයේදී මෙකී ලක්ෂණ එකක් හෝ කිහිපයක් ඇති විට ගැබ් ගත් බව සිතිය හැකිය. මාස් ශුද්ධිය නතර විය හැකි වෙනත් රෝග අවස්ථාද ඇතැම් විට පාරිසරික හෝ මානසික හේතුන් ආදී වෙනත් හේතුවක් නිසා ඇති වූ තත්ත්වයන්ද යන්න වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගත හැකිය.

උදෑසන වමනය හෝ ඔක්කාරය දරුණු ලෙස වමනයක් බවට පත්වීමෙන් මව දුර්වල විය හැකිය. එවැනි අවස්ථාවලදී වෛද්‍ය උපදෙස් ගත යුතුය.

නිතර මුත්‍රා පහවීමේ රෝගී අවස්ථාවක් නම් මධුමේහ හෙවත් දියවැඩියාව තිබේදැයි පරීක්ෂා කළ යුතුය. ඇතැම් විට ගැබිනි බවේ ලක්ෂණයක් ලෙසද මුත්‍රාබාධ තිබිය හැකිය. එවැනි අවස්ථාවද නිරාකරණය කිරීමට වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුය. මෙම කරුණු පිළිබඳව අවබෝධයෙන් සුපරීක්ෂා වීමෙන් මාතෘ සංරක්ෂණය හා නීරෝගී දරුවන් ලැබීමේ වාසනාව උදා වනු ඇත.

උපදෙස්
වෛද්‍ය
**නන්ද කස්තුරිආරච්චි**

සටහන
**ජයන්ති කුරේ**



# කුෂ්ට රෝග නසන ලේ පිරිසිදු කරන වැල්මදට

**දේශීය වෛද්‍ය ක්‍රමයේ මෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ද ඖෂධයක් වශයෙන් බොහෝ සෙයින් ප්‍රයෝජනවත් ද්‍රව්‍යයක් වශයෙන් වැල්මදට හැඳින්වීමට පුළුවන. මදට යනු මංජිෂ්ඨා යන නාමයෙන් බිඳී ආ හෙළ වදනයි. මදට හෙවත් මදටිය යනුවෙන් ගැනෙන ගස් වර්ගයක්ද ඇති නිසා මෙම වර්ගය හැඳින්වීම සඳහා වැල් යන්න මුලට එකතු කර ඇත.**

තවද ෂඩ්වර්ණයෙන් පස්වෙනි වර්ණයද ගැනෙනුයේ මංජිෂ්ඨා නාමයෙනි. එමගින් මදට වැලෙහි වර්ණය ගනු ලබයි. මේ නිසා රත් පැහැ මදයක් සහිත වැල් වැල්මදට නමින් හඳුන්වයි. ශ්‍රී ලංකාවේ ජනතාව වැල්මදට භාවිතයට ගනු ලබන්නේ ඖෂධයක් වශයෙන්ම වන අතර විශේෂයෙන් ගම්බද වැසියන් චර්ම රෝග සන්ධි ආබාධ වැනි රෝගවලදී අත් බෙහෙතක් වශයෙන්ද උපයෝගී කරගනී. එමෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී විවිධ ඖෂධයන් සඳහා සංයෝග ඖෂධයක් ලෙස භාවිතයට ගනු ලබයි. මේවායේදී බොහෝ සෙයින් භාවිතයට ගනු ලබන්නේ වැල්මදට මුල් වන අතර බොහෝ රෝගාබාධයන් සඳහා මෙය ඉතා ප්‍රයෝජනවත් ද්‍රව්‍යයක් වෙයි.

එසේම දේශීය ඖෂධ තෛල ආදිය නිෂ්පාදනයේ දී මෙය වර්ණකයක් වශයෙන්ද භාවිතයට ගනු ලබන බවද දක්වා ඇත. එසේම ඖෂධීය වශයෙන් ඉතා ඉහළ වටිනාකමක් ගනු ලබන නිසා වර්තමානයේ මේ සඳහා ඉහළ මිලක් ගෙවීමට වෛද්‍යවරුන්ට සහ රෝගීන්ට සිදුව ඇත.

**වැවෙන ප්‍රදේශ :**

**විදේශීය වශයෙන් :-**

වයඹ දිග හිමාලය, නීලගිරි, කාශ්මීර, නේපාලය හා ඇෆ්ගනිස්තානය ආදී පර්වත ප්‍රදේශවල වැවෙන බව දක්වා ඇත.

**දේශීය වශයෙන් :-**

ශ්‍රී ලංකාවේ මැදරට, කඳුරට, ද්විතියික හා විසිරුණු වනාන්තරවල දක්නට ලැබෙන අතර විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ගලහ, බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොල, බණ්ඩාරවෙලද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාළුගම, හෝර්ටන් තැන්න, හග්ගල, කඳපොළ ආදී ප්‍රදේශවලද පිදුරුතලාගල අවටද වැවෙන බව හඳුනාගෙන ඇත. බොහෝ විට අඩි 3000 – 4000 අතර උස් ප්‍රදේශවල බහුලව දක්නට ලැබේ.

**පැළැටියේ ස්වරූපය :**

මෙය ලතා හෙවත් වැල් විශේෂයක් වන අතර ලපටි ශාකයේ කඳ කොටස හතරැස් ස්වරූපයකින් යුක්ත වෙයි. එසේම මේරූ පසු වෘත්තාකාර ස්වරූපයක් ගනු ලබයි. එසේම මෙම වැල ඉහළට වැඩීයාම සඳහා පහුරු ආකාරව පිහිටා ඇති අතර ඒවා ඉතාම කටු ආකාරයට දැකිය හැක. මෙම වැල එක දිගට නොව ඛණ්ඩකීය බවක් දක්නට ලැබෙන අතර එක් ඛණ්ඩයක් අවසානයේ පත්‍ර 4ක් විහිදී ඇත.

පත්‍රවල දිග නටුවක් පවතින අතර කොළ අඟල් 1/2- 1 ක් දක්වා දිග වන අතර අඟල් 1/4 - 1/2දක්වා පළලින් යුතුය. මෙම කොල සිනිඳු හා දිලිසෙන සුළු ගතියෙන් යුක්ත වන අතර කොළ පටන් ගන්නා තැන ඉලිප්පාකාරවද අග ප්‍රදේශය උල් හැඩයක්ද ගනු ලබයි. මෙහි මල් කොළ පැහැයට හුරු සුදු පැහැ වන අතර මලක පෙති 4ක් ඇති නමුත් එම පෙති වෙන්ව නොපවතී. මෙහි ඇති ගෙඩි අමු අවස්ථාවේදී කොළ පාටද ඉදුණු පසු දම්පාටද වෙයි. එසේම මෙම ගෙඩි වල ස්ත්‍රී සහ පුරුෂ බීජ දෙවර්ගයම ඇත.

**මෙම ශාකය පිළිබඳව විවිධ භෘෂාවලින් හඳුන්වන නාමයන් පිළිබඳව සළකා බැලීමේදී :**

**පොදු සිංහල නාමය :-** වැල්මදට වේ.

**සංස්කෘත බසින් :-** මංජිෂ්ඨා, අරුණා, රක්තයෂ්ඨී, රක්තා, කාලමේෂිකා, සමංගා, යෝජනවල්ලි, වස්ත්‍රභූෂණා, වස්ත්‍රරංජනී, ජ්වරහන්තී, චිත්‍රා, චිත්‍රලතා, චිත්‍රාජගී, ජනනී, නාග කුමාරිකා, රාගාන්දි මන්ඩුක පර්ණී, කාලා, ගණ්ඩාලී, රසායනී, ජද්මා, විජයා, ගෞරී, පද්මා, රෝහිණී, භාණ්ඩි ආදී නාමයන් රාශියක් දක්නට ලැබේ.

මේ අතුරින්, මංජිෂ්ඨන, අරුණා, රක්තයෂ්ඨී, රක්තා කාල, හරිණී යන නාම යෙදී ඇත්තේ රක්ත වර්ණයෙන් යුතු යන අරුතිනි. ගෙඩිවල පැහැය අනුව 'කාලමේෂිකා' යන නාම යෙදෙන අතර රත්පැහැ වර්ණය නිසා 'සමංගා' යන නාමයද යෙදේ. ජ්වර රෝග නසන යන අරුතින් 'ජ්වරහන්තී' යන නම යෙදෙන අතර දිගවැල් යන අරුතින් 'යෝජන වල්ලී' යන නම යෙදේ.

වස්ත්‍ර වර්ණවත් කිරීමට යොදාගන්නා යන අරුතින් වස්ත්‍රභූෂණා හා වස්ත්‍රරංජනී යන නාමයන්ද යෙදේ.

**හින්දි බසින් වැල් මදට සඳහා :-** මාංජිඨ යන නාමය යෙදෙන අතර

**දෙමළ බසින් :-** මන්දිට්ටු සහ සෙව්වල්ලි යන නම් යෙදෙයි.

**වංග බසින් :-** මංජිෂ්ඨා යන නම යෙදේ.

**ඉංග්‍රීසි බසින් :-** Indian madder, Dyer's madder හා Heart leaved madder යන නම් යෙදේ.

**වැල්මදට වල උද්භිද විද්‍යාත්මක නාමය** Rubia Cordifolia Linn වන අතර කුලය Rubuaceae හෙවත් මංජිෂ්ඨා කුලය වෙයි.

මේ ආදී වශයෙන් විවිධ භාෂාවලින් විවිධ නම් රාශියකින් හඳුන්වනු ලබන වැල්මදටවල ඖෂධ සඳහා ගනු ලබන අංග වන්නේ මුල් සහිත සම්පූර්ණ ලතාවයි. විශේෂයෙන් මුල් ගනු ලබයි.

**වැල් මදට වල අඩංගු රසායනික උපාදාන :**

මුලෙහි දුම්මල සහිත පදාර්ථ, මැලියම් ශකීරා, රංජක ද්‍රව්‍ය, චූර්ණ ලවණද රංජක ද්‍රව්‍ය යෙහි Purpurin නම් රක්ත වර්ණ ස්ඵටිකමය පදාර්ථයන්ද ඇතුළත් වේ.

**ඖෂධීය ගුණ :**

රසයෙන් මධුර තික්ත කෂාය වන අතර ගුණයෙන් ගුරු හා රූක්ෂ වේ. විර්යයෙන් උෂ්ණ වන අතර විපාකයෙන් කටුක වෙයි. දෝෂ අනුව සැලකීමේදී මෙය සෙම් පිත් සමන ගුණ යුක්ත වන අතර සෙම් පිත් රෝග සඳහා උපයෝගී කරනු ලබයි.

**ව්‍යුහගත ක්‍රියා සැලකීමේදී**

**බාහිර වශයෙන් :**

මෙය ශෝථහර, ව්‍රණ රෝපණ සහ කුෂ්ඨග්න ගුණයන්ගෙන් යුක්ත වන අතර ශෝථ, ව්‍රණ, චර්ම රෝග ආදියේදී ආලේප ලෙස යොදයි.

**අභ්‍යන්තර වශයෙන් :**

**නාඩි ව්‍යුහාවේදී**

මෙය මොළයට මෙන්ම වාත නාඩි වලටද සහනය ලබාදෙන අතර මොළයේ උද්වේගයට හේතුවන රෝග සඳහා යොදනු ලබයි.

**ආහාර පිරිපචන ව්‍යුහාවේදී**

මෙය දීපන, පාචන, ස්තම්භන හා කෘමිග්න ගුණ යුක්ත වන අතර බඩගිනි අඩුකම ආමදෝෂ අතීසාර කෘමී රෝග අදියේදී ප්‍රයෝග කරයි.

**රුධිර සංසරණ ව්‍යුහාවේදී**

මෙය ලේ නතර කරන සහ ලේ පිරිසිදු කරන ගුණයෙන් යුතු අතර රත්පිත සහ රක්ත දෝෂ සඳහා ප්‍රයෝග කරයි.

**ශ්වසන ව්‍යුහාවේදී**

සෙම නසන ගුණ යුක්ත නිසා ස්වර භේද හා කාස සඳහා යොදයි.

**ප්‍රජනන ව්‍යුහාවේදී**

මෙය ගර්භාෂය උත්තේජකද ස්තන ශෝධකද ආර්තව ජනකද ගුණයන්ගෙන් යුක්ත නිසා කෂ්ඨාර්තව හා රජෝරෝධයට උපයෝගී වෙයි. එසේම ප්‍රසවයෙන් පසු ගර්භාෂය ශෝධනයට ස්තනය (මව්කිරි) ශුද්ධියට හා ජ්වර ප්‍රතිශෝධයට යොදනු ලබයි.

**මුත්‍ර ව්‍යුහාවේදී**

ප්‍රමේහ නසන ගුණ යුතු නිසා ප්‍රමේහ රෝග වලදී ප්‍රයෝග කරයි. එසේම කුෂ්ඨ නසන ගුණ යුතු නිසා කුෂ්ඨ හා විසර්ප ආදී චර්ම රෝග සඳහා උපයෝගී කර ගනු ලබන අතර ජ්වරඝ්න ගුණ ඇති නිසා සාමාන්‍ය ජ්වරයේදී ජීර්ණ ජ්වරයේදී සහ සූත්‍රිකා ජ්වරයේදී යොදයි. එසේම වැල්මදට වර්ණකර බලකර විෂ්හර හා රසායන ගුණ යුතු නිසා වර්ණ විකෘතිතා දුබලතා සහ විෂ ආදියේදී යොදයි. මේ ආදී වශයෙන් ශාරීරික ව්‍යුහ ආශ්‍රිතව ඉතා හොඳින් ක්‍රියාකාරී වන ද්‍රව්‍යයක් ලෙස වැල්මදට හැඳින්විය හැක.

එසේම බොහෝ රෝගයන් සඳහා වැල්මදට අඩංගු ඖෂධ යෝග යෙදෙන අතර ඒවා අතුරින් කිහිපයක් නම්,

**කුෂ්ඨ වලට**

වැල්මදට මීපැණියෙන් අඹරා ආලේප කරයි.

**අභිඝාත ආදියට**

වැල්මදට මුල් කාඩියෙන් අඹරා ආලේප කරයි.

ගින්නෙන් පිළිස්සුනු ව්‍රණ සඳහා

වැල්මදට සුදුහඳුන් මුරුවා මුල් සමඟ පිසගත් ගිතෙල් ආලේපය යොදයි.

**ප්‍රමේහයට**

වැල්මදට සුදු හඳුන් කෂාය දීම

මේ ආදී බොහෝ ඖෂධ ප්‍රයෝග විවිධ රෝගාබාධ සඳහා වැල්මදට අඩංගුව යෙදෙයි. තවද මෙයට අමතරව වැල්මදට අඩංගු සංස්කාරික ඖෂධ යෝගද රාශියක් දක්නට ලැබෙන අතර ඒවා ක්වාථ, චූර්ණ අරිෂ්ඨ ආසව හා තෛලවල යෙදෙයි.

මේ අතුරින් මංජිෂ්ඨාදී ක්වාථය මහා මංජිෂ්ඨාදී ක්වාථය මංජිෂ්ඨාදී තෛලය

මංජිෂ්ඨාදී ඝෘතය ආදිය ප්‍රධාන තැනක් ගනු ලබයි. මෙයට අමතරව වැල්මදට අඩංගු තවත් ඖෂධයෝ රාශියක් වෙයි. මේ සියල්ල මිනිසාට බොහෝ සෙයින් වැළදෙන රෝග වැඩි ප්‍රමාණයකට සහනය ළඟාකර ගැනීමට උදව් වෙයි.

තවද ගුප්ත බලපෑම් නිසා ඇති වන ආබාධ දුරුකරන ද්‍රව්‍යයක් වශයෙන්ද මෙය ගනු ලබන අතර ඇස් වහ වැනි දෝෂ වලින් මිදීමට ළමුන්ගේ සහ සුරතල් සතුන්ගේ බෙල්ල වටා වැල්මදට බඳිනු ලබන බවද පැවසේ. මෙසේ සලකා බලන කල වැල් මදටවල ඖෂධීය වටිනාකම ඉතා ඉහළ මට්ටමක පවතින බව පෙනේ.

තවද වැල්මදට අධිකව ගැනීමට යම් උපද්‍රවයන්ට හේතු විය හැක.

එනම් නාඩිව්‍යුහාවට පීඩා කරන අතර භ්‍රමය හෙවත් කැරකිල්ල ප්‍රලාපය හෙවත් දෙඩවීමද ඇති වේ. මේ නිසා නියමිත මාත්‍රානුකූලව එනම් චූර්ණය රක්තිකා 6 – 24 දක්වාද ක්වාථය කර්ෂ 5 – 10 දක්වාද ගැනීම ඉතාමත් ගුණදායකය.

මේ නිසා ඉතාමත් ගුණ දෙන අගනා ඖසුවක් වන වැල්මදට නිසිලෙස රෝග සඳහා යොදා ගැනීමෙන් බොහෝ රෝග සමනය කරගත හැක.



පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්ය, වෛද්‍ය
මධුර පරණවිතාන

වර්ෂ 2023 ක් වූ අප්‍රේල් 28 වැනිදු සිකුරාදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.